**අවසාන වාර පරීක්ෂණය • 13 ශ්‍රේණිය - 2026**

| ආර්ථික විද්‍යාව I<br>Economics I | 21 | S | I | පැය දෙකයි<br>Two Hours |
|---|---|---|---|---|

**උපදෙස්:**
- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.**
- **උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැළකිල්ලෙන් කියවා පිළිපදින්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1),(2),(3),(4) සහ (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරාගෙන එය පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි ⊗ යොදන්න.**

1. නොමිල භාණ්ඩයක් ලෙස සැලකිය හැක්කේ පහත සඳහන් කවරක්ද?
   (1) දඩයක්කරුවන් විසින් ස්වභාවික රක්ෂිතයකින් දඩයම් කරගනු ලබන සතුන්
   (2) ශ්‍රී ලංකා රජයෙන් පාසල් සිසුන් සඳහා නොමිලේ සපයනු ලබන නිල ඇඳුම් රෙදි
   (3) උතුරු මැද පළාතේ වී ගොවීන් හට නොමිලේ සැපයෙන වාරි ජලය
   (4) ලුණු ලේවායන්හි ලුණු නිපදවීමට භාවිතා කරනු ලබන මුහුදු ජලය
   (5) මධ්‍ය කඳුකරයේ ඇති ජල විදුලි බලාගාරවලින් නිපදවනු ලබන ජල විදුලිය

2. නැව්, මහාමාර්ග, කර්මාන්ත ශාලා සහ න්‍යෂ්ටික බලාගාර ආදිය අයත් වන්නේ
   (1) දිගුකාලීන පරිභෝජන භාණ්ඩවලට ය.
   (2) සංසරණ ප්‍රාග්ධනයට ය.
   (3) සමාජ යටිතල පහසුකම්වලට ය.
   (4) දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයට ය.
   (5) ස්ථාවර ප්‍රාග්ධනයට ය.

3. ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය 2026.02.28 දින සිට ඉරානයට ගුවන් ප්‍රහාර එල්ල කිරීමත් සමග ඉන්ධන මිල ගණන් තියුනු ලෙස ඉහළ ගිය අතර එයට හේතුව ලෙස සැලකිය හැක්කේ,
   (1) සියලුම මිනිස් වුවමනා සපුරාලීමට ප්‍රමාණවත් තරම් ඛනිජ තෙල් නොපැවතීම ය.
   (2) සැපයුම් දාම අවහිර වීම නිසා ලෝක වෙළෙඳපොළේ ඛනිජ තෙල් හිඟයක් හට ගැනීම ය.
   (3) ලෝකය සතුව නිශ්චිත ඛනිජතෙල් සම්පත් ප්‍රමාණයක් පැවතීම ය.
   (4) ඛනිජ තෙල් සැපයුම සීමා සහිත වුව ද මිනිස් වුවමනා අසීමිත වීම ය.
   (5) ඛනිජ තෙල්වලින් එකිනෙකට වෙනස් භාණ්ඩ විශාල සංඛ්‍යාවක් නිපදවීමට හැකි වීම ය.

4. නිෂ්පාදන හැකියා වක්‍රය හා සම්බන්ධ ප්‍රකාශ අතුරින් නිවැරදි වනුයේ කුමක් දැයි හඳුනාගන්න.
   (1) එහි සෑම ලක්ෂයක ම සම්පත් බෙදීයාම කාර්යක්ෂම වේ.
   (2) එහි නිෂ්පාදන කාර්යක්ෂමතාව තෘප්ත වන්නේ එක් ලක්ෂ්‍යක පමණි.
   (3) වක්‍රය දිගේ ඉහළට හෝ පහළට ගමන් කරන විට මුළු ආවස්ථික පිරිවැය වැඩිවේ.
   (4) වක්‍රයට ඇතුළත සංයෝග අකාර්යක්ෂම වුව ද වක්‍රයට පිටත සංයෝග කාර්යක්ෂම වේ.
   (5) වක්‍රය ඉදිරියට විතැන් වන විට සම්පත් සම්භාරය වැඩි වේ.

5. වෙළෙඳපොළක ඉල්ලුම් වක්‍රය දිගේ ඉහළට යන විට පාරිභෝගිකයන් මිලට ගැනීමට සූදානම් ප්‍රමාණය පහළ වැටේ නම් එයට හේතුව,
   (1) පාරිභෝගිකයින් සාපේක්ෂ මිල අඩු ආදේශකවලට මාරු වීම ය.
   (2) නිෂ්පාදකයින් සැපයුම අඩුකර වෙනත් භාණ්ඩ නිපදවීම ය.
   (3) පාරිභෝගිකයන්ගේ වැයකළ හැකි නාමික ආදායම අඩු වීම ය.
   (4) මිල ඉහළ යන විට පාරිභෝගික තෘප්තිය පහළ වැටීම ය.
   (5) සාපේක්ෂ මිල වෙනස් නොවුව ද පාරිභෝගිකයින්ගේ මූර්ත ආදායම අඩුවීම ය.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

6. කිසියම් භාණ්ඩයක ඉල්ලුම,
   (1) දෙන ලද මිලක දී පාරිභෝගිකයින් විසින් මිලට ගැනීමට සූදානම් ප්‍රමාණයකි.
   (2) විවිධ මිලයන් යටතේ මිලට ගැනීමට අපේක්ෂා කරන විවිධ ප්‍රමාණ සමූහයකි.
   (3) අඩු කිරීමට අවශ්‍ය නම් රජය කළ යුත්තේ එහි මිල ඉහළ දැමීම යි.
   (4) සෑම විට ම එහි සැපයුමට සමාන වන බැවින් වෙළෙඳපොළ සමතුලිත වේ.
   (5) ඉල්ලුම් වක්‍රයේ විවිධ ලක්ෂයන් අතුරින් එක් ලක්ෂයකින් නිරූපණය වේ.

7. ශ්‍රී ලංකාවේ බෝංචි වෙළෙඳපොළෙහි සැපයුම වැඩි වීමට හේතු වන්නේ පහත සඳහන් කවර කරුණක්ද?
   (1) බෝංචිවලට වෙළෙඳපොළෙහි පවතින මිල පහළ වැටීම ය.
   (2) කැරට්වල වෙළෙඳපොළ මිල පහළ වැටීම ය.
   (3) ලීක්ස් සඳහා වෙළෙඳපොළේ පවතින මිල ඉහළ යාම ය.
   (4) සැපයුම් දාම අවහිර වීම නිසා පොහොර මිල ඉහළ ඉහළ යාම ය.
   (5) රාබු සහ නෝකෝල් සඳහා වෙළෙඳපොළේ ඉල්ලුම ඉහළ යාම ය.

8. පූර්ණ තරගකාරී වෙළෙඳපොළක සමතුලිත ප්‍රමාණය නොවෙනස්ව පවතිද්දී සමතුලිත මිල ඉහළ යාමට හේතුවන කරුණ හඳුනාගන්න.
   (1) සැපයුම වැඩිවීම
   (2) ඉල්ලුම වැඩිවීම
   (3) ඉල්ලුම වැඩිවන විට සැපයුම අඩුවීම
   (4) ඉල්ලුම හා සැපයුම වැඩිවීම
   (5) ඉල්ලුම හා සැපයුම අඩුවීම

9. චාප මිල ඉල්ලුම් නම්‍යතාවෙන් මනිනු ලබන්නේ,
   (1) ඉල්ලුම් වක්‍රයක ලක්ෂ්‍ය දෙකක නම්‍යතාවයි.
   (2) දෙන ලද මිලකට අදාළ නම්‍යතාවයි.
   (3) ඉල්ලුම් වක්‍රයක ලක්ෂ්‍ය දෙකක් අතර මධ්‍ය ලක්ෂ්‍යයේ නම්‍යතාවයි.
   (4) මිලෙහි වෙනස ශුන්‍යට ආසන්න වනවිට මිල ඉල්ලුම් නම්‍යතාවයි.
   (5) සමස්ත ඉල්ලුම් වක්‍රයේ ම නම්‍යතාවයි.

10. තරගකාරී වෙළෙඳපොළක ඉල්ලුම: Qd = 160-4p ද සැපයුම: Qd =-20+5p ද වේ යැයි සිතන්න. නිෂ්පාදකයින් සමතුලිත ප්‍රමාණයෙන් අඩක් පමණක් සැපයුම් කිරීමට තීරණය කළහොත් මුළු පාරිභෝගික අතිරික්තය
   (1) රු.600කින් අඩුවේ.
   (2) රු.800 සිට 300 දක්වා අඩුවේ.
   (3) රු.800 කින් අඩුවේ.
   (4) රු.800 සිට 840 දක්වා වැඩිවේ.
   (5) වෙනසකට භාජනය නොවේ.

11. ගිෆන් භාණ්ඩයක වෙළෙඳපොළ මිල පහළ වැටෙන විට,
   (1) ආදේශන ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් ප්‍රමාණය වැඩිවේ.
   (2) ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් ප්‍රමාණය වැඩිවේ.
   (3) ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාකය මගින් ඉල්ලුම් ප්‍රමාණය අඩු කරයි.
   (4) ආදායම් හා ආදේශන යන ප්‍රතිවිපාක දෙක ම ඉල්ලුම් ප්‍රමාණය අඩු කරයි.
   (5) ආදායම් ප්‍රතිවිපාකය මගින් ඉල්ලුම් ප්‍රමාණය වැඩි වුවද ආදේශන ප්‍රතිවිපාකය මගින් ඉල්ලුම් ප්‍රමාණය අඩුවේ.

12. ශ්‍රී ලංකාවේ සහල් වැනි අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩයක් මත සඵල උපරිම මිල පාලනයක් ක්‍රියාත්මක කළ විට වෙළෙඳපොළේ දක්නට ලැබෙන තත්වයක් නොවන්නේ පහත සඳහන් කවරක්ද?
   (1) භාණ්ඩයේ ගුණත්වය පහළ දැමීම.
   (2) නිෂ්පාදකයින් විසින් භාණ්ඩ තොග රැස් කිරීම.
   (3) වෙළෙඳුන් විසින් භාණ්ඩය සැඟවීම.
   (4) පාලන මිල යටතේ හිඟයකින් තොරව භාණ්ඩය සැපයීම.
   (5) පාලන මිලට ඉහළින් භාණ්ඩය අලෙවි කිරීම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

13. පාරිභෝගිකයන්ගෙන් නිෂ්පාදකයින් වෙත ආදායම් ප්‍රතිව්‍යාප්ත කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රතිපත්ති හඳුනාගන්න.
(1) නිශ්චිත නිෂ්පාදන බද්දක් ඉවත් කිරීම
(2) සහතික මිල යටතේ ඌණ පූර්ණ ගෙවීම
(3) සමතුලිතයට ඉහළින් අවම මිලක් නියම කිරීම
(4) සඵල උපරිම මිලක් නියම කිරීම
(5) නිශ්චිත නිෂ්පාදන සහනාධාරයක් ලබාදීම

14. තරගකාරී වෙළෙඳපොළක සැපයුම; Qs = -40+2p වන බවත්, වෙළෙඳපොළ සමතුලිත වන විට පාරිභෝගිකයින් ඒකක 100ක් මිලට ගනී නම් මුළු නිෂ්පාදක අතිරික්තය කොපමණද?
(1) රු. 1000 කි. (2) රු. 1500 කි. (3) රු. 1800 කි. (4) රු. 2000 කි. (5) රු. 2500 කි.

15. කිසියම් ආයතනයක් වැඩෙන පරිමාණානුකූල ඵල අත්විඳින අතර එහි දැනට නිමැවුම් මට්ටම ඒකක 1800කි.; ආයතනය සියලුම යෙදවුම් 20%කින් ඉහළ දැමුවහොත් එහි නිමැවුම් මට්ටම විය හැක්කේ පහත සඳහන් කුමන අගයක්ද?
(1) 1440 කි. (2) 1620 කි. (3) 1900 කි. (4) 2160 කි. (5) 2250 කි.

16. පහත සඳහන් සමීකරණ අතුරින් නිවැරදි වනුයේ කුමක්ද?
(1) මුළු ආර්ථික ලාභය = මුළු අයභාරය - මුළු ප්‍රත්‍යක්ෂ පිරිවැය
(2) ආර්ථික ලාභය + ගිණුම්කරණ ලාභය = මුළු ලාභය
(3) ගිණුම්කරණ ලාභය - වක්‍ර පිරිවැය = ඍජු පිරිවැය
(4) ආර්ථික ලාභය = මුළු පිරිවැය - මුළු අයභාරය
(5) ආර්ථික ලාභය + වක්‍ර පිරිවැය = ගිණුම්කරණ ලාභය

17. කිසියම් භාණ්ඩයක් නිපදවනු ලබන ආයතන තනිව මිල වෙනස් කිරීම වෙනුවට සියලු ආයතනවල එකඟතාව මත මිල ඉහළ දමන්නේ නම් එම වෙළෙඳපොළට අදාළ නොවන ලක්ෂණය හඳුනාගන්න.
(1) මිල නොවන තරගය
(2) මිල දැඩියාව
(3) ප්‍රවේශයට බාධක පැවතීම
(4) ආයතනය පැවරුණු මිලකට මුහුණ දීම
(5) ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාව

18. යම් නිෂ්පාදන ආයතනයක් නිමැවුම කොතරම් වෙනස් කළ ද එහි ආන්තික අයභාරය නොවෙනස් ව පවතී නම්,
(1) එම ආයතනය පහළට බෑවුම් වෙන ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙයි.
(2) ආයතනය සහ කර්මාන්තය යන දෙක ම එකිනෙකට සමාන වේ.
(3) නිපදවනු ලබන්නේ සමජාතීය භාණ්ඩයකි.
(4) එම කර්මාන්තයට ඇතුළත්වීමේ ප්‍රබල බාධක පවතී.
(5) වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය ස්වරූපයක් ගනී.

19. පහත සඳහන් සමීකරණ අතුරින් නිවැරදි වනුයේ කුමක්ද?
(1) දළ නිමැවුමේ වටිනාකම = දළ එකතු කළ වටිනාකම - අතරමැදි පරිභෝජනය
(2) මූලික මිල = නිෂ්පාදකයින්ගේ මිල + භාණ්ඩ හා සේවා මත සහනාධාර - භාණ්ඩ හා සේවා මත බදු
(3) සමස්ත පරිභෝජනය = කුටුම්භ පරිභෝජනය + කුටුම්භ ඉතුරුම්
(4) සමස්ත දළ එකතු කළ වටිනාකම + ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය = දළ දේශීය නිෂ්පාදිතය
(5) දළ මෙහුම් අතිරික්තය = ශුද්ධ මෙහෙයුම් අතිරික්තය + සේවක ආදායම්

20. පහත සඳහන් දෑ අතුරින් නිෂ්පාදන ඉමට ඇතුළත් කරන්නේ කුමක්ද?
(1) අයිතිකරුවන් වාසය කරන නිවෙස්වලින් සැපයෙන නේවාසික සේවාව
(2) තමන් විසින් තමන්ගේ වුවමනා ඉටු කර ගැනීමට සපයා ගනු ලබන ස්වයං සේවා
(3) පෙර වසරක දී නිපදවූව ද මෙම වසරේ මුල්වරට අලෙවි වන භාණ්ඩ
(4) විදුලිය නිපද වීම සඳහා භාවිතා කරනු ලබන සූර්ය ශක්තිය
(5) විවේක කාලයේ දී දෙමව්පියන් විසින් දරුවන්ට ඉගැන්වීම


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

21. ආදායම් ප්‍රවේශය යටතේ මූලික මිලට දළ එකතු කළ වටිනාකම ලබා ගැනීමට දළ මෙහෙයුම් අතිරික්තය එකතු කළ යුතු ප්‍රාථමික ආදායම් කවරේද?
(1) සේවක ආදායම්, දළ මිශ්‍ර ආදායම සහ නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු
(2) සේවක ආදායම්, ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය සහ නිෂ්පාදනය මත ශුද්ධ බදු
(3) සේවක ගෙවීම්, ශුද්ධ මිශ්‍ර ආදායම සහ නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු
(4) දළ මිශ්‍ර ආදායම, නිෂ්පාදනය මත ශුද්ධ බදු සහ නිෂ්පාදිතය මත ශුද්ධ බදු
(5) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය, සේවක ආදායම් සහ විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම

22. පහත සඳහන් ඳැ අතුරින් ආර්ථිකයක පෞද්ගලික (කුටුම්භ) ආදායමට ඇතුළත් වන්නේ කුමක්ද?
(1) රාජ්‍ය ව්‍යවසායන්හි ලාභ
(2) සමාජ සංරක්ෂණ දායක වීම්
(3) නොබෙදූ සමාගමික ලාභ
(4) සමාගමික ආදායම් බදු
(5) පෞද්ගලික ආදායම් බදු

23. පහත රූප සටහනේ දැක්වෙන ආර්ථිකයෙහි පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටම රු.1000ක් නම්, ආර්ථිකය පූර්ණ සේවා නියුක්තියට රැගෙන යාම සඳහා යෝග්‍ය ප්‍රතිපත්තිය හඳුනාගන්න.




(1) සෘජු බදු රු.100කින් අඩු කිරීම.
(2) කුටුම්භ සංක්‍රාම රු.120කින් ඉහළ නැංවීම.
(3) සෘජු බදු සහ රාජ්‍ය වියදම් රු.200 බැගින් ඉහළ දැමීම.
(4) සෘජු බදු සහ කුටුම්භ සංක්‍රාම රු.250 බැගින් ඉහළ දැමීම.
(5) රාජ්‍ය වියදම් රු.100කින් ඉහළ දැමීම.

24. පහත රූපසටහන මගින් දැක්වෙන ආර්ථිකයෙහි පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටම 4000ක් නම් එයින් නිගමනය කළ හැක්කේ,




(1) අවධමනය පරතරයක් ඇති බව ය.
(2) සෘණ නිමැවුම් පරතරයක් ඇති බව ය.
(3) අනපේක්ෂිත තොග සමුච්චනයක් ඇති බව ය.
(4) අවපාතෝද්ධමනයක් ඇති බව ය.
(5) යෙදවුම්වලට ඇති අධි ඉල්ලුම නිසා ඒවා අකාර්යක්ෂම ලෙස භාවිත වන බවයි.

25. විවෘත ආර්ථිකයක කාන්දුවීම් ශ්‍රිතය ; W = 60 + 0.25Y වන අතර අපනයන = 100ක් ද, රාජ්‍ය වියදම = 160ක් ද වන අතර සමතුලිත ජාතික ආදායම = 1000ක් ද වේ නම් ආයෝජන වියදමෙහි වටිනාකම කොපමණද?
(1) 80 කි. (2) 75 කි. (3) 60 කි. (4) 50 කි. (5) 40 කි.

26. කිසියම් ආර්ථිකයක පවත්නා මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 25000ක් වන අතර මූර්ත දළ දේශීය නිෂ්පාදනය රු.බිලියන 1000කි. ආදායම් බිහිකිරීම සඳහා මුදල් ඒකකයක් අතිනත හුවමාරු වන සාමාන්‍ය වාර ගණන 5කි. මෙම ආර්ථිකයේ මුදල් ගුණකය 5ක් නම් සංචිත මුදල් ප්‍රමාණය කොපමණද?
(1) රු.බි. 500 කි. (2) රු.බි. 750 කි. (3) රු.බි. 1000 කි. (4) රු.බි. 1250 කි. (5) රු.බි. 5000 කි

27. පහත දැක්වෙන්නේ 20%ක සංචිත අවශ්‍යතාවක් ඇති වාණිජ බැංකු පද්ධතියක එක් බැංකුවක ශේෂ පත්‍රයයි.

| වගකීම් | රු. මිලියන | වත්කම් | රු. මිලියන |
|---|---|---|---|
| ප්‍රාග්ධනය<br>ඉල්ලුම් තැන්පතු | 10,000<br>40,000 | සංචිත<br>ණය<br>සුරකුම්පත් | 10,000<br>25,000<br>15,000 |
| | 50,000 | | 50,000 |

ගනුදෙනු කරුවෙකු මෙම බැංකුවෙන් රු.මි. 2000ක් ආපසු ලබාගත හොත් (තැන්පතු මුදල් කරගතහොත්) බැංකුවට ලබා දිය හැකි අලුත් ණයවල උපරිම මට්ටම කොපමණද?
(1) රු.මි. 40 කි. (2) රු.මි. 400 කි. (3) රු.මි. 450 කි. (4) රු.මි. 500 කි. (5) රු.මි. 800 කි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

28. වර්තමාන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තියෙහි ඉලක්කය වනුයේ
   (1) එක්දින ප්‍රතිපත්ති අනුපාතිකය ස්ථාවරව පවත්වා ගැනීම ය.
   (2) හරිත සාමාන්‍ය අන්තර් බැංකු ඒක්ෂණ පොලී අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති අනුපාතිකයට සමානව පවත්වා ගැනීම ය.
   (3) මතුපිට උද්ධමන අනුපාතිකය 5%ක මට්ටමේ මැදිකාලීනව පවත්වා ගැනීම ය.
   (4) මූලික උද්ධමන අනුපාතිකය මැදිකාලීනව තනි මැද ඉලක්කමක පවත්වා ගැනීම ය.
   (5) සාමාන්‍ය මිල මට්ටමේ දෝලනයන් ඉවත් කර උද්ධමන අනුපාතිකය ශුන්‍ය මට්ටමක පවත්වා ගැනීමය.

29. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය 5%ක් වන වාණිජ බැංකු පද්ධතියක එක් වාණිජ බැංකුවක් ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මහ බැංකුවෙන් රුපියල් මිලියන 400ක ණයක් ලබා ගතහොත් එම ණය මුදල ආශ්‍රයෙන් වාණිජ බැංකුවට ලබා දිය හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණද?
   (1) රු.මි. 380 කි.
   (2) රු.මි. 400 කි.
   (3) රු.මි. 2000 කි.
   (4) රු.මි. 4000 කි.
   (5) රු.මි. 8000 කි.

30. පහත සඳහන් ක්‍රියාවලිය හැඳින්විය හැක්කේ කුමන නමකින්ද?
   ❖ **ප්‍රතිපත්ති පොලී අනුපාතය ඉහළ දැමීම → පරිභෝජනය සහ ආයෝජන අඩුවීම→ සමාහාර ඉල්ලුම පහළ වැටීම → මිල මට්ටම අඩුවීම**
   (1) ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යනුවෙනි.
   (2) සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යනුවෙනි.
   (3) ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය යනුවෙනි.
   (4) සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය යනුවෙනි.
   (5) නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යනුවෙනි.

31. පූර්ණ තරගකාරී වෙළෙඳපොළක අලෙවි වන භාණ්ඩයක පරිභෝජනයේ ඍණ බාහිරතාවයක් පවතින විට,
   (1) සමතුලිත නිමැවුම් මට්ටමේ දී ආන්තික සමාජ පිරිවැයට වඩා ආන්තික සමාජ ප්‍රතිලාභය විශාල වේ.
   (2) පරිභෝජනය දිරිගැන්වීම තුළින් වෙළෙඳපොළ කාර්යක්ෂමතාවට ළඟාවිය හැක.
   (3) පරිභෝජනය අධෛර්යමත් කිරීම තුළින් සමාජ ශුභ සාධනය වැඩි කළ හැක.
   (4) ආන්තික සමාජ පිරිවැය ආන්තික පෞද්ගලික පිරිවැය ඉක්මවා යයි.
   (5) වෙළෙඳපොළ යාන්ත්‍රණය නිවැරදි කිරීමට ආණ්ඩුව මැදිහත් වුවහොත් සමජ ශුභසාධනය අඩුවේ.

32. පහත සඳහන් ඒවා අතරින් ශුද්ධ පොදු භාණ්ඩය කුමක්ද?
   (1) ප්‍රදීපාගාරයකින් නිකුත් කරන ආලෝක සංඥා
   (2) පාසල් අධ්‍යාපනය
   (3) මහජන ප්‍රවාහන සේවය
   (4) මහා මාර්ග හා අධිවේගී මාර්ග
   (5) ගිනි නිවීමේ සේවාව

33. පහත සඳහන් වියදම් අතුරින් රජයේ පුනරාවර්තන වියදමට අයත් නොවන්නේ කුමක්ද?
   (1) පොලී ගෙවීම්
   (2) ණය ආපසුගෙවීම්
   (3) කුටුම්භ සංක්‍රාම
   (4) රාජ්‍ය සේවක වැටුප්
   (5) රාජ්‍ය සංස්ථා සඳහා පැවරුම්

34. ශ්‍රී ලංකාවේ වර්තමාන රජයේ බදු ව්‍යූහය තුළ අනුක්‍රමික, සමානුපාතික හා ප්‍රතික්‍රමික බදු නිවැරදිව දැක්වෙන පිළිතුර හඳුනාගන්න.

| | <u>අනුක්‍රමික</u> | <u>සමානුපාතික</u> | <u>ප්‍රතික්‍රමික</u> |
|---|---|---|---|
| (1) | පෞද්ගලික ආදායම් බද්ද | එකතු කළ වටිනාකම් බද්ද | මධ්‍යසාර මත සුරාබදු |
| (2) | උපයන විට ගෙවන බද්ද | නිෂ්පාදන බදු | පෞද්ගලික ආදායම් බද්ද |
| (3) | එකතු කළ වටිනාකම් බද්ද | උපයන විට ගෙවන බද්ද | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| (4) | ප්‍රාග්ධන ආදායම් බද්ද | නිෂ්පාදන බදු | ජාතිය ගොඩනැගීමේ බද්ද |
| (5) | සමාගම් ආදායම් බද්ද | පෞද්ගලික ආදායම් බද්ද | ප්‍රාග්ධන ලාභ බද්ද |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

35. පහත සඳහන් මූලාශ්‍රවලින් 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමට වැඩිම දායකත්වයක් සපයා ඇත්තේ කුමක්ද?
(1) ආනයනය මත බදු
(2) නිෂ්පාදන/ සුරා බදු
(3) බදු නොවන ආදායම
(4) ආදායම් බදු
(5) වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද

36. පහත සඳහන් ඇ අතුරින් සාපේක්ෂ වාසි නීතියට පදනම් වන උපකල්පනයක් නොවන්නේ කුමක්ද?
(1) ප්‍රවාහන පිරිවැයක් නොපවතින බව ය.
(2) භාණ්ඩ සඳහා භාණ්ඩ හුවමාරු වන බව ය.
(3) රටවල් අතර සාධක සංචලනය කළ නොහැකි බව ය.
(4) සම්පත් සමජාතීය නොවන බව ය.
(5) ආවස්ථික පිරිවැය ස්ථාවරව පවතින බව ය.

37. පහත වගුවෙන් දැක්වෙන්නේ නිශ්චිත සමජාතීය සම්පත් සම්භාරයකින් A සහ B යන රටවල් දෙකට ස්ථාවර ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවිය හැකි උපරිම X හා Y භාණ්ඩ ප්‍රමාණන් ය.

| | A | B |
|---|---|---|
| X භාණ්ඩය | 240 | 50 |
| Y භාණ්ඩය | 120 | 100 |

සාපේක්ෂ වාසි නීතියට අනුව රටවල් දෙක අතර වෙළඳාමක් සිදු නොවන්නේ පහත සඳහන් කවර ජාත්‍යන්තර හුවමාරු අනුපාතය යටතේද?
(1) X = 0.75Y (2) X = Y (3) X = 1.25Y (4) X = 1.75Y (5) X = 2Y

38. ශ්‍රී ලංකාවේ ලොකු ලූනු නිපදවන අතර කොටසක් ලෝක වෙළෙඳපොළෙන් ආනයනය කරයි. ලෝක මිල කිලෝ 1ක් රු. 80 කි. දේශීය නිෂ්පාදකයෝ ලොකු ලූනු කිලෝ 1ක් නිපදවීමට ආනයනික යෙදවුම් රු.20ක් භාවිත කරති. රජය සියලු ආනයන මත 50%ක තීරු බද්දක් පැනවූව හොත් සඵල ආරක්ෂණ අනුපාතය වනුයේ සියයට
(1) 100 කි. (2) 80 කි. (3) 50 කි. (4) 40 කි. (5) 25 කි.

39. ශ්‍රී ලංකාවේ විදේශ ණය අර්බුධය හේතුවෙන් ගෙවිය යුතු විදේශ ණය ප්‍රමාණයක් චීනය විසින් කපාහැරීමට තීරණය කළ හොත් එය ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයේ සටහන් වන්නේ කුමන ගිණුමේද?
(1) ද්විතීක ආදායම් ගිණුම
(2) ප්‍රාග්ධන ගිණුම
(3) මූල්‍ය ගිණුම
(4) ප්‍රාථමික ආදායම් ගිණුම
(5) සේවා ගිණුම

40. විනිමය අනුපාතිකය විදේශ විනිමය වෙළෙඳපොළේ ඉල්ලුම් හා සැපයුම් බලවේග මත තීරණය වීමට ඉඩ හැර තාවකාලික දෝලනයන් ඉවත් කිරීමට මහ බැංකුව විදේශ විනිමය මිලට ගැනීම හා විකිණීම මගින් මැදිහත් වේ නම් පවතින්නේ,
(1) පාවෙන විනිමය අනුපාත ක්‍රමයකි.
(2) පාලිත පාවෙන විනිමය අනුපාත ක්‍රමයකි.
(3) චල ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයකි.
(4) ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයකි.
(5) බහුවිධ විනිමය අනුපාත ක්‍රමයකි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

41. 2022 අර්බුධයෙන් පසුව ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟතාවට පැමිණි විස්තීර්ණ අරමුදල් පහසුකම් (EFF) වැඩසටහනේ අරමුණක් නොවූයේ පහත සඳහන් කුමක්ද?
(1) ණය බර අඩු කිරීම
(2) බදු ප්‍රතිසංස්කරණ මගින් රාජ්‍ය ආදායම වැඩි කිරීම
(3) විදේශ සංචිත ඉහළ දමා ගැනීම
(4) සාර්ව ආර්ථික ස්ථායිතාව ඇති කිරීම
(5) දරිද්‍රතාව අඩු කිරීම

42. පහත රූපයට අනුව විදේශ විනිමය වෙළෙඳපොළේ සමතුලිතය A සිට B කරා ගමන් කර රුපියලේ විදේශ අගය ඉහළ යාමට හේතුව හඳුනාගන්න.
(1) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඩොලර් මිලියන 695ක ණය වාරිකයක් මුදා හැරීම.
(2) ආනයන සීමා කිරීම නිසා ආනයන වියදම් අඩුවීම.
(3) යුධවාතාවරණය නිසා අපනයන ඉපැයුම් අඩුවීම.
(4) විදේශ ණය ආපසු ගෙවීම ආරම්භ කිරීම.
(5) ශ්‍රී ලාංකිකයින් විදේශ සංචාර අවලංගු කිරීම.




43. පහත සඳහන් දෑ අතුරින් ආර්ථික සංවර්ධනයේ මූලිකාංගයක් නොවන්නේ කුමක්ද?
(1) ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම
(2) දරිද්‍රතාව පහළ වැටීම
(3) ආදායම් විෂමතාව අඩුවීම
(4) රාජ්‍ය ණය තිරසාර මට්ටමක පැවතීම
(5) කෘෂි අංශය අභිබවා කාර්මික හා සේවා අංශ පුළුල් වීම.

44. ෆොසිල ඉන්ධන වෙනුවට සූර්ය ශක්තිය යොදා ගැනීම හා සාගර මත්ස්‍ය සම්පත අධිභාවිතය (overfishing) වැළැක්වීම අයත් වන්නේ
(1) තිරසාර ආර්ථික වෘද්ධියට ය.
(2) තිරසාර සංවර්ධනයට ය.
(3) මානව සංවර්ධනයට ය.
(4) ආර්ථික සංවර්ධනයට ය.
(5) සමාජ සංවර්ධනයට ය.

45. ආහාර, පිරිසිදු ජලය, වස්ත්‍ර, වාසස්ථාන හා සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණවත්ව සපයා ගැනීමට අවශ්‍ය ආදායම් නොලැබීම හඳුන්වන්නේ
(1) බහුමාන දරිද්‍රතාව යනුවෙනි.
(2) මානව දරිද්‍රතාව යනුවෙනි.
(3) නිරපේක්ෂ දරිද්‍රතාව යනුවෙනි.
(4) සාපේක්ෂ දරිද්‍රතාව යනුවෙනි.
(5) ඌණ සංවර්ධනය යනුවෙනි.

46. කිසියම් රටක ලෝරන්ස් වක්‍රය (Lorenz curve) සම ව්‍යාප්ති රේඛාව දෙසට ගමන් කිරීමට හේතුවන සංසිද්ධි හඳුනාගන්න.
(1) ආදායම් විෂමතාව පහළ මට්ටමක සිට ඉහළට ගමන් කිරීම
(2) ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය ඉහළ යාම
(3) නිරපේක්ෂ දරිද්‍රතාව 40% සිට 30% දක්වා අඩුවීම
(4) ඍජු බදු අඩුකර ඒ වෙනුවට වක්‍ර බදු ආදේශ කිරීම
(5) ආදායම් බදු අනුපාත සහ කුටුම්භ සංක්‍රාම ඉහළ නැංවීම

47. යම් නිෂ්පාදනය කාර්යයකට සත්‍ය වශයෙන් අවශ්‍ය ශ්‍රමිකයින් ප්‍රමාණයට වඩා වැඩි සංඛ්‍යාවක් සේවා නියුක්ත වී සිටී නම් එවිට දක්නට ලැබෙන්නේ,
(1) පූර්ණ සේවා නියුක්තිය යි.
(2) ඌණ සේවා නියුක්තිය යි.
(3) ව්‍යුහමය සේවා වියුක්තිය යි.
(4) සැඟවුණු සේවා වියුක්තිය යි.
(5) ඉච්ඡානුගත සේවා වියුක්තිය යි.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

48. අඩු ආදායම් රටවල් සඳහා පහළ පොලී අනුපාත සහිත ණය සැපයීමටත් ප්‍රදාන ලබා දීමටත් සම්බන්ධ වන ලෝක බැංකු සමූහයට අයත් ආයතනය කුමක්ද?
   (1) ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා ජාත්‍යන්තර බැංකුව (IBRD)
   (2) ජාත්‍යන්තර මූල්‍ය සමායතනය (IFC)
   (3) ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA)
   (4) බහු පාර්ශවික ආයෝජන සහතික කිරීමේ නියෝජිතායතනය (MIGA)
   (5) ආයෝජන ආරවුල් නිරාකරණය කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථාන (ICSID)

49. 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ස්ථාවර මිල යටතේ දළ දේශීය නිෂ්පාදනයේ ආංශික සංයුතිය තුළ සේවා අංශය කෘෂි අංශය මෙන් ආසන්න වශයෙන් කී ගුණයක් වී තිබේද?
   (1) 10 ගුණයකි.
   (2) 8 ගුණයකි.
   (3) 6 ගුණයකි.
   (4) 5 ගුණයකි.
   (5) 4 ගුණයකි.

50. 2024 අවසානයේ දී පැරිස් සමාජයට (Paris Club) අයත් රටවල් අතරින් ශ්‍රී ලංකාවට වැඩිම ද්වීපාර්ශික ණය ලබා දී තිබූ රටවල් දෙක කවරේද?
   (1) ජපානය සහ ප්‍රංශය
   (2) චීනය සහ ඉන්දියාව
   (3) ජපානය සහ චීනය
   (4) රුසියාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය
   (5) චීනය සහ ප්‍රංශය


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

අවසාන වාර පරීක්ෂණය • 13 ශ්‍රේණිය - 2026

ආර්ථික විද්‍යාව II
Economics II

21 S II

පැය තුනයි
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
Additional Reading Time – 10 Minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛතාවය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදා ගන්න.

**උපදෙස්:**
- 'අ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද, 'ආ' උපකොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## 'අ' උපකොටස
(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

1. (i) යථානුරූපී ප්‍රකාශ සහ අභිමතානුරූපී ප්‍රකාශ අතර වෙනස දක්වන්න. (ල. 04)
   (ii) a. නිෂ්පාදන සම්පත්වල ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ල. 02)
   b. නිෂ්පාදන අකාර්යක්ෂමතාව යනුවෙන් කුමක් අදහස් වේද? එය නිෂ්පාදන හැකියා මායිමක් ඇසුරින් ඔබ නිරූපණය කරන්නේ කෙසේද? (ල. 04)
   (iii) මිනිසා විසින් ස්වභාවික සම්පත් අධි උපයෝජනය කිරීම තුළින් ගෝලීය වශයෙන් පැන නගින ගැටලු කවරේද? (ල. 04)
   (iv) a. මිශ්‍ර ආර්ථික පද්ධතියක ප්‍රධාන ලක්ෂණ දක්වන්න. (ල. 03)
   b. සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයන් සැබෑ ලොව ක්‍රියාත්මක වේ. උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 03)

2. (i) සැපයුම් නීතිය නිර්වචනය කර සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ල. 04)
   (ii) කිසියම් භාණ්ඩයක මිල ඉහළ යන විට අයභාරය පහළ යයි නම් එයට හේතු කවරේද? (ල. 02)
   (iii) කිසියම් තරගකාරී වෙළෙඳපොළක අලෙවි වන එක්තරා භාණ්ඩයක ඉල්ලුම හා සැපයුම පිළිබඳව පහත තොරතුරු ඔබට සපයා ඇත.

| P(මිල) | Qd(ඉ/ප්‍ර) | Qs(සැ/ප්‍ර) |
|---|---|---|
| 10 | 108 | 8 |
| 24 | 24 | 64 |

   a. ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ගොඩනගා සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න. (ල. 04)
   b. සමතුලිතයේදී මිල ඉල්ලුම් නම්‍යතාව සහ මිල සැපයුම් නම්‍යතාව සොයන්න. (ල. 02)
   (iv) තරගකාරී කුකුළුමස් වෙළෙඳපොළක් සඳහා පහත සිදුවීම් සමතුලිතයට සිදුවන බලපෑම රූප සටහන් භාවිතයෙන් පහැදිලි කරන්න.
   a. කුකුළන් අතර කුරුළු උණ පැතිරයන බවට ප්‍රචාරණය වීම.
   b. කුකුළන් සඳහා ලබාදෙන එන්නත් මිල ඉහළ යාම.
   c. බිත්තර මිල ඉහළ යාම.
   d. ධීවර කර්මාන්තය සඳහා රජය සහනාධාරයක් ලබාදීම. (ල.1*4=4)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources
iexamhub

(v) ගිෆන් භාණ්ඩයක මිල ඉහළ යාමකදී ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාකය හැසිරෙන ආකාරය පැහැදිලි කරන්න. (ල. 04)

3. (i) තරගකාරී වෙළෙඳපොළක භාණ්ඩයක් මත බදු පැනවීම නිසා වෙළෙඳපොළක් අකාර්යක්ෂම වේද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ල. 04)

(ii) තරගකාරී වෙළෙඳපොළක අලෙවි වන භාණ්ඩයක් සඳහා සඵල උපරිම මිලක් නියම කිරීම හේතුවෙන් හටගන්නා ආර්ථික ප්‍රතිවිපාක 4ක් නම් කරන්න. (ල. 04)

(iii) වෙළෙඳපොළක අලෙවි වන එක්තරා භාණ්ඩයක් පිළිබඳ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත දැක්වේ.

$Qd = 4000-2p$ $Qs = -2000+4p$

රජය මෙම භාණ්ඩයේ ඒකකයක් සඳහා රු.150ක සහනාධාරයක් ලබා දීමට අපේක්ෂා කරන්නේ නම්,

a. සහනාධාරයට පෙර සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය දක්වන්න?

b. රජයේ සහනාධාර පිරිවැය කොපමණද?

c. මෙම ඒකක සහනාධාරය මුළුමනින් ම නිෂ්පාදකයාට හිමිවන්නේද? ඔබේ පිළිතුර හේතු සහිතව පහැදිලි කරන්න.

d. මෙම සහනාධාරය තුළින් සමාජ ශුභ සාධනයට වන බලපෑම දක්වන්න. (ල.2*4=8)

(iv) කෘෂි ගොවීන්ගේ ආදායම සහ කෘෂි භාණ්ඩ මිල ස්ථායීකරණය සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද? (ල. 04)

4. (i) කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියෙහි නිමැවුම හැසිරෙන ආකාරය පැහැදිලි කර එම හැසිරීම පදනම් වන උපකල්පන මොනවාදැයි දක්වන්න. (ල. 04)

(ii) පරිමාණානුකූල ඵල හා දිගුකාලීන සාමාන්‍ය පිරිවැය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ල. 04)

(iii) ලාභ උපරිමනය කිරීමේ නීතිය යනු කවරක්ද? මිල ගනුවෙක් වශයෙන් ක්‍රියාකරන නිෂ්පාදන ආයතනයක් සම්බන්ධයෙන් එම නීතිය ප්‍රකාශ කළ හැක්කේ කෙසේද? (ල. 04)

(iv) පූර්ණ තරගකාරී ආයතනයක් සිය ලාභ උපරිම නිමවුම් මට්ටමේ දී ආන්තික පිරිවැය රු.40/-ක් වන අතර එහි මුළු අයභාරය රු.3200/-කි. එම නිමැවුම් මට්ටමේ දී ආයතනය රු.240/-ක අලාභයක් උපයයි නම් සහ නිෂ්පාදන අතිරික්තය රු.160/-ක් වේ නම්,

a. ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය කොපමණද? (ල. 02)

b. මෙම ආයතනයේ ඒකකයක වෙළෙඳපොළ මිල රු.10/-කින් අඩුවන විට නිමවුම ඒකක 40කින් අඩුවන විට අතර මුළු විචල්‍ය පිරිවැය ද රු.2320/-කින් අඩුවේ නම් ආයතනය සිය නිෂ්පාදනය තවදුරටත් පවත්වා ගත යුතු ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල. 02)

(v) එක් සාධක වෙළෙඳපොළක ආර්ථික බදු කුලිය ශූන්‍ය වීමටත් තවත් වෙළෙඳපොළක සංක්‍රාම ඉපයුම් ශූන්‍ය වීමටත් හේතුව රූපසටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ල. 04)

5. (i) කිසියම් රටක ආර්ථික ප්‍රදේශය භූගෝලීය සීමාවට වෙනස් වූවකි. ආර්ථික ප්‍රදේශයට අයත් වන සංඝටක හතරක් දක්වන්න. (ල. 04)

(ii) නිෂ්පාදන ඉමට ඇතුළත් වන ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් මොනවාද? (ල. 04)

(iii) ආර්ථිකයක යම් වර්ෂයක ජාතික ගිණුම් සංඛ්‍යා දත්ත කිහිපයක් පහත දැක්වේ.

කෘෂි අංශයේ එකතු කළ වටිනාකම---800
විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම---1400
සේවක ආදායම ---2500
නිෂ්පාදිතය මත බදු - එම සහනාධාර---1200
නිෂ්පාදිතය මත වෙනත් බදු - එම සහනාධාර---300
කාර්මික අංශයේ දළ එකතු කළ වටිනාකම---4000
දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය---2800
දළ මිශ්‍ර ආදායම ---3500
පෞද්ගලික පරිභෝජනය---6000
සේවා අංශයේ දළ එකතු කළ වටිනාකම---5000
අපනයන---2500
ආනයන---3500
දළ මෙහෙයුම් අතිරික්තය---**3500**
රජයේ මිලට ගැනීම්---3200
විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම---(-400)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

a. දළ ජාතික ආදායම (ල. 02)
b. වැය කළ හැකි දළ ජාතික ආදායම (ල. 02)
c. දේශීය ඉතුරුම්
ජාතික ඉතුරුම් (ල. 02)

(iv) ආර්ථිකයක ආන්තික පරිභෝජන නැඹියාව 0.8 යැයි උපකල්පනය කරන්න.
a. රජය රාජ්‍ය වියදම් රු.බිලියන 100කින් ද ස්ථාවර බදු රු. බිලියන 100කින් ද එකවර වැඩි කළහොත් සමතුලිත ජාතික ආදායමට සිදුවන බලපෑම පැහැදිලි කරන්න. (ල. 04)
b. මෙම ආර්ථිකයේ ස්වාධීන ආයෝජනය රු.බි.50කින් ඉහළ ගියහොත් පරිභෝජනයට සිදුවන බලපෑම කුමක්ද? (ල. 02)

'ආ' උපකොටස
(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

6. (i) පුද්ගලයින් මුදල් තමන් වෙත රඳවා ගැනීමට සුවිශේෂි රුචියක් දක්වයි. මෙයින් හෙළි වන ආර්ථික සංකල්පය සහ එවැනි මුදල් ළඟ තබා ගැනීමට බලපාන හේතු කවරේද? (ල. 04)
(ii) පහත සඳහන් සංකල්ප අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.
a. ව්‍යවහාර මුදල් සහ ආසන්න මුදල් (ල. 02)
b. ආදේශන මුදල් සහ විද්‍යුත් මුදල් (ල. 02)
(iii) ඇමෙරිකාව, ඊශ්‍රායලය සහ ඉරානය අතර ඇති වූ යුධ ගැටුම් නිසා ශ්‍රී ලංකාවේ ඇති වූ උද්ධමනය ප්‍රස්ථාරිකව පැහැදිලි කරන්න. (ල. 04)
(iv) "ශ්‍රී ලංකා මහ බැංකුව 2026 මැයි මස අවසානයේ දී එක් දින ප්‍රතිපත්ති අනුපාතය 7.75% සිට 8.75% දක්වා ඉහළ දමන ලදි." මෙම තීරණය මිල මට්ටම කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.(අවශ්‍ය නම් රූප සටහනක් භාවිත කරන්න.) (ල. 04)
(v) රු.බිලියන 8500ක මුදල් සැපයුමක් සහිත ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතියේ ඒකාබද්ධ ශේෂ පත්‍රය පහත දැක්වේ.

| වගකීම් | රු.බිලියන | වත්කම් | රු.බිලියන |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 4000 | සංචිත | 500 |
| | | ණය | 3500 |
| | 4000 | | 4000 |

බැංකු පද්ධතියේ අධි සංචිත නොමැත. මහජනතාව තමන් සතු ව්‍යවහාර මුදල් රු.බි.500ක් බැංකු පද්ධතියේ තැම්පත් කළහොත් ණය දීමේ ක්‍රියාවලිය අවසන් වූ විට,
a. ආර්ථිකයේ මුළු මුදල් සපයුම කොපමණද? (ල. 02)
b. මුදල් ගුණකයේ අගය කුමක් ද? (ල. 02)

7. (i) වෙළෙඳපොළ අසමත් වීම යන්නෙන් කුමක් අදහස් කෙරේද? එයට හේතු වන සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාව හට ගන්නා මූලික අවස්ථා හතරක් ලියන්න. (ල. 05)
(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ බදු සංචරකවල මෑත කාලීන සාපේක්ෂ වැදගත්කම කොපමණ අගයක් ගෙන තිබේද? (ල. 03)
(iii) රාජ්‍ය අයවැය හිඟය පියවීම සඳහා බැංකු සහ බැංකු නොවන වෙළෙඳපොළ මූලාශ්‍ර යොදා ගැනීමේ ආර්ථික ප්‍රතිවිපාක විමසන්න. (ල. 04)
(iv) a. වර්තමාන ශ්‍රී ලංකාවේ මෙහෙයුම් අලාභ ලබන රාජ්‍ය ව්‍යවසායන් 04ක් දක්වන්න. (ල. 04)
b. ඒවායේ දුර්වල කාර්යසාධනයට බලපා ඇති සාධක හතරක් දක්වන්න. (ල. 04)

8. (i) ඉන්දියාව සහ චීනය යන දෙරටට ම සමාන සම්පත් ප්‍රමාණයක් උරුම වී ඇතැයි හා දෙරටම රෙදිපිළි හා විදුලි පංකා නිපදවන්නේ යැයි ද සිතන්න. එක් එක් රට රෙදි පිළි හා විදුලි පංකා ඒකකය බැගින් නිපදවීමට අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය පහත දැක්වේ.

| | ඉන්දියාව | චීනය |
|---|---|---|
| රෙදිපිළි | 10 | 6 |
| විදුලි පංකා | 5 | 4 |


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

a. දෙරට අතර අන්‍යෝන්‍ය වාසි දායක වෙළෙඳාමක් ඇති වීමක් සඳහා එක් එක් රට විශේෂීයකරණය කළ යුතු භාණ්ඩය කුමක්ද? (ල. 04)

b. එක් එක් රටට ශ්‍රම ඒකක 120 බැගින් හිමි වී ඇත්නම් අන්‍යෝන්‍ය ලෙස වාසිදායක හුවමාරුවක් බිහිවීමට දෙරට අතර භාණ්ඩ හුවමාරු කර ගත යුතු අනුපාතික පරාසය දක්වන්න. (ල. 02)

(ii) a. දේශීය කර්මාන්තවලට ආර්ක්ෂනයක් ලබා දීමට පක්ෂව තර්ක කවරේද? (ල. 02)

b. සඵල ආරක්ෂණ අනුපාතිකය නිර්වචනය කර එයට බලපාන සාධක 2ක් දක්වන්න. (ල. 03)

(iii) ශ්‍රී ලංකාව සම්බන්ධ වී ඇති ද්විපාර්ශවික ගිවිසුම් කවරේද? (ල. 02)

(iv) ද්විත්ව සටහන් මූලධර්මය යොදා ගනිමින් පහත සඳහන් ගණුදෙණු ශ්‍රී ලංකාවේ ගිණුම් ශේෂ ලේඛනයෙහි වාර්තා කරනුයේ කෙසේදැයි සඳහන් කරන්න.

a. ශ්‍රී ලංකාව ඇමෙරිකානු ඩොලර් 10,000ක් වටිනා තේ තොගයක් ඇමෙරිකාවට අපනයනය කිරීම.

b. ශ්‍රී ලංකාව චීනයෙන් ලබා ගත් ණය සඳහා ඇ.ඩො.මිලියන 200ක වාරිකයක් ගෙවීම.

c. කුවේටයේ කර්මාන්ත ශාලාවක සේවය කරන අමල් තම මවට ඇ.ඩො.100ක් එවීම.

d. ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවය කරන අරුන්දති සිය දියණියට ඇ.ඩො.50ක් එවීම. (ල. 04)

(v) රටක විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය වීමේ ආර්ථික ප්‍රතිවිපාක දක්වන්න. (ල. 03)

9. (i) ආර්ථික වෘද්ධිය යන්නෙන් අදහස් කර්න්නේ කුමක්ද? එය නිරූපණය කළ හැකි විකල්ප ක්‍රම 02ක් පැහැදිලි කරන්න. (ල. 04)

(ii) a. මානව සංවර්ධනයේ දී මිනිස් ජීවිතයේ වර්ධනය විය යුතු පැතිකඩ තුන කවරෙද? (ල. 03)

b. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා අස්වැසුම වැඩසටහන ප්‍රබලව දායක වී ඇත. මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? විමසන්න. (ල. 04)

(iii) ශ්‍රී ලංකාවේ 2019 කුටුම්භ ආදායම් හා වියදම් සමීකරණයට අනුව පහළම ආදායම් ලබන 20% හා ඉහළම ආදායම් ලබන 10% මුළු ආදයමෙන් ලබා ගෙන ඇති සාපේක්ෂ අගයන් කවරේද? (ල. 02)

(iv) a. ප්‍රජා විද්‍යා සංක්‍රාන්තියට අනුව ඒ ඒ අවධිවල දී දළ උපත් අනුපාතිකය සහ දළ මරණ අනුපාතිකය හැසිරෙන ආකාරය පැහැදිලි කරන්න. (ල. 04)

b. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ මෑත කාලීනව දැකිය හැකි ලක්ෂණ මොනවාද? (ල. 03)

10. (i) ශ්‍රී ලංකාවේ උගත් හා තරුණ ශ්‍රමිකයන් අතර ඉහළ සේවා වියුක්ති තත්වයක් දක්නට ලැබේ. මෙයට හේතු පෙන්වා දෙන්න. (ල. 05)

(ii) වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකයට බලපා ඇති උග්‍ර විදෙශ විනිමය හිගය අඩු කර ගැනීමට යොදාගත හැකි උපාය මාර්ග කවරේද? (ල. 05)

(iii) ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්වය සැළකිල්ලට ගනිමින් රාජ්‍ය ණය කළමනාකරණයේ වැදගත්කම සහ ආර්ථික ස්ථායීතාවට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල. 05)

(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුවට බාධාකාරී වන ගෝලීය සාධක කවරේද? (ල. 05)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය , 2026
13 ශ්‍රේණිය අවසන් වාර පරීක්ෂණය

ආර්ථික විද්‍යාව I
Economics I

21 S

## ලකුණු දීමේ පටිපාටිය

### I පත්‍රය

| ප්‍රශ්න අංක | පිළිතුරු අංක | ප්‍රශ්න අංක | පිළිතුරු අංක | ප්‍රශ්න අංක | පිළිතුරු අංක | ප්‍රශ්න අංක | පිළිතුරු අංක | ප්‍රශ්න අංක | පිළිතුරු අංක |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 4 | 11 | 1 | 21 | 1 | 31 | 3 | 41 | 5 |
| 2 | 5 | 12 | 4 | 22 | 5 | 32 | 1 | 42 | 1 |
| 3 | 2 | 13 | 3 | 23 | 5 | 33 | 2 | 43 | 4 |
| 4 | 3 | 14 | 5 | 24 | 5 | 34 | 1 | 44 | 2 |
| 5 | 1 | 15 | 5 | 25 | 4 | 35 | 4 | 45 | 3 |
| 6 | 2 | 16 | 5 | 26 | 3 | 36 | 4 | 46 | 5 |
| 7 | 2 | 17 | 4 | 27 | 2 | 37 | 5 | 47 | 4 |
| 8 | 3 | 18 | 3 | 28 | 3 | 38 | 3 | 48 | 1 |
| 9 | 3 | 19 | 2 | 29 | 2 | 39 | 2 | 49 | 2 |
| 10 | 1 | 20 | 1 | 30 | 4 | 40 | 2 | 50 | 1 |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

1.(i)

- ආර්ථික සංසිද්ධීන් සහ විචල්‍යයන් අතර ඇති සම්බන්ධතා පැහැදිලි කිරීමට යොමු වූ විෂය බද්ධ ප්‍රකාශ යථානුරූපී ප්‍රකාශවලට අයත් වන අතර සිදුවිය යුතු දේ ගැන කියැවෙන සාරධර්ම විනිශ්චයන් අඩංගු පුද්ගල බද්ධ ප්‍රකාශ අභිමතානුරූපී ප්‍රකාශ වලට අයත් වේ.
- යථානුරූපී ප්‍රකාශ ප්‍රත්‍යක්ෂ දත්ත සමග සැසඳීමෙන් ‘හරි’ද, නැතිනම් ‘වැරදි’ද යන්න පරීක්ෂා කර නිශ්චිත නිගමනයකට පැමිණිය හැකි නමුත් අභිමතානුරූපී ප්‍රකාශ ප්‍රත්‍යක්ෂ දත්ත මගින් පරීක්ෂා කර ‘හරි’ හෝ ‘වැරදි’ ලෙස නිගමනය කළ නොහැක.
- සියලුම ආර්ථික විද්‍යා න්‍යායන් ගොඩනැගී ඇත්තේ යථානුරූපී ප්‍රකාශ මතය . අභිමතානුරූපී ප්‍රකාශ වලින් සිදු කරනු ලබන්නේ ආර්ථික ගැටලු වලට නිර්දේශ ඉදිරිපත් කිරීමයි.
- යථානුරූපී ප්‍රකාශ විද්‍යාත්මක ස්වරූපයක් ගන්නා අතර අභිමතානුරූපී ප්‍රකාශ පෞද්ගලික මතය හෝ දෘෂ්ටිවාද නිරූපණය කරනු ලබයි.

(වෙනස්කම් 4ක් සඳහා ල.1 බැගින් ල.04)

(ii.) (a)

- වුවමනාවන්ට සාපේක්ෂ හිඟකමකින් යුක්ත වීම.
- විකල්ප ප්‍රයෝජන සහිත වීම.
- ආර්ථික කටයුතුවලට යොදාගැනීමේදී ආවාස්ථික පිරිවැයක් හට ගැනීම.
- එකිනෙකට ආදේශ කළ හැකි වීම (ශ්‍රමය වෙනුවට යන්ත්‍ර)
- ඵලදායිතාවකින් යුක්ත වීම (නිෂ්පාදිතයක් බිහි කිරීමට හැකි වීම)

(කරුණු දෙකකට ල.02 )

(b)

- දෙන ලද සම්පත් සම්භාරයකින් පවතිනා තාක්ෂණය යටතේ නිපදවිය හැකි උපරිම නිමැවුම් මට්ටම නොනිපදවීම හෝ ඒකකයක් නිපදවිය හැකි අවම පිරිවැයක් යටතේ නොනිපදවීම නිෂ්පාදන අකාර්යක්ෂමතාවයි. (ල.02)
- නිෂ්පාදනය අකාර්යක්ෂම වන විට සම්පත් පූර්ණ සේවා නියුක්තියෙන් හා උපරිම ඵලදායිතාවයකින් සේවා නියුක්ත නොවන නිසා ආවස්ථික පිරිවැයකින් තොරව එක් භාණ්ඩයකවත් නිමැවුම ඉහළ දැමිය හැක. (ල.01)
- නිෂ්පාදනය අකාර්යක්ෂම වන විට ආර්ථිකයේ සැබෑ නිමැවුම නිෂ්පාදන හැකියා මායිමට ඇතුළත ලක්ෂයක පිහිටයි. පහත රූපයේ දැක්වෙන පරිදි ආර්ථික a,b හෝ c වැනි ඕනෑම භාණ්ඩ මිශ්‍රණයක් නිපදවන විට නිෂ්පාදනය අකාර්යක්ෂම වේ.

(ල.01)






iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iii)

- සම්පත් ක්ෂය වීම නිසා ආර්ථික වෘද්ධිය මන්දගාමී වීම
- අනාගත පරපුරේ ජීවන තත්ත්වය පහළ වැටීම
- පාංශුහායනය
- ගෝලීය උණුසුම ඉහළ යාම
- ධ්‍රැවීය ග්ලැසියර දිය වීම සහ සාගර ජල මට්ටම් ඉහළ යාම
- කාලගුණ විපර්යාස හට ගැනීම
- වායු දූෂණය
- සාගර දූෂණය

(කරුණු 4කට ල.04)

(iv) (a)

- දේපළ අයිතිය පෞද්ගලික අංශය සහ රාජ්‍ය අතර බෙදී යාම
- මිල යාන්ත්‍රණය සහ රාජ්‍ය සැලසුම්කරණය මිශ්‍රව මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම
- පෞද්ගලික අංශය ස්වාර්ථයෙන් ද රාජ්‍ය අංශය සමාජ ශුභ සාදනයෙන්ද අභිප්‍රේරණය වීම
- පෞද්ගලික ව්‍යවසායන් සහ රාජ්‍ය ව්‍යවසායන් තරගකාරීව නිෂ්පාදන කටයුතුවල යෙදීම
- පෞද්ගලික ව්‍යාපාරිකයින් පාරිභෝගිකයින් අයුතු ලෙස සූරා කෑමට උත්සාහ කිරීම හා රජය නීති හා රෙගුලාසි මගින් පාරිභෝගිකයාව ආරක්ෂා කිරීම
- ආර්ථික ස්ථායීතාව ඇති කිරීම, සාධාරණත්වය ප්‍රවර්ධනය හා සම්පත් කාර්යක්ෂමව බෙදාහැරීමට රජය මැදිහත් වීම.

(කරුණු තුනකට ල.03)

(b)

- සමාජ ශුභසාධනය, සාධාරණත්වය සහ සැමට සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා රජය පුළුල් ලෙස මැදිහත් වන නිදහස් වෙළඳපොළ ආර්ථික පද්ධතියක් සමාජීය වෙළඳ පොළ ආර්ථික පද්ධතියක් ලෙස සැලකේ.
- පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම, සමාජ ආරක්ෂණ ජාල, කම්කරු අයිතිවාසිකම් තහවුරු කිරීම හා මූලික අයිතිවාසිකම් තහවුරු කිරීම ආදිය සඳහා ආණ්ඩුවේ සෘජු මැදිහත්වීමක් මෙම ආර්ථිකවල සිදුවේ.
- පෞද්ගලික දේපළ අයිතිවාසිකම් තහවුරු කිරීම, ගිවිසුම්වල වලංගුභාවය නීති ගත කිරීම සහ වෙළඳපොළ තරගකාරීත්වය ඇති කිරීම ආදිය සඳහා දැඩි ලෙස රජය මැදිහත් වේ.
- වැඩිහිටියන්, ළමුන්, රෝගීන් හා ආබාධිත පුරවැසියන් ආරක්ෂා කිරීමට විශේෂ සුභ සාධන වැඩසටහන් ක්‍රියාත්මක වේ. උදාහරණ :- ජර්මනිය, නෝර්වේ, පින්ලන්තය, ස්විඩනය, ඩෙන්මාර්ක්

(කරුණු තුනකට ල.03)

2.(i)

- දෙන ලද කාල පරිච්ඡේදයක් තුළ භාණ්ඩයක සැපයුමට බලපාන මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව පවතී නම් භාණ්ඩයක මිල සහ එහි සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම (ධන) සම්බන්ධතාවක් පවතින බව සැපයුම් නීතියෙන් කියැවේ.

(ල.02)

- සැපයුම් වක්‍රයක් ඉහළට බෑවුම්වීමට බලපාන සාධක දෙකක් තිබේ.

1.ආර්ථික ලාභය: මිල ඉහළ යන විට ලාභය වැඩි වන නිසා වැඩි ලාභයක් ලබා ගැනීමට නිෂ්පාදකයෝ සැපයුම් ප්‍රමාණය වැඩි කරති.

(ල.01)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

2.ආන්තික පිරිවැය: කෙටි කාලයේදී නිෂ්පාදනය හීනවන ආන්තික ඵලදා නීතියට යටත් වන නිසා නිමැවුම වැඩි කරන විට ආන්තික පිරිවැය ඉහළ යන බැවින් එය ආවරණය කරගත හැකි වන පරිදි මිල ඉහළ ගියොත් පමණක් සැපයුම් ප්‍රමාණය වැඩි කරනු ඇත.

(ල.01)

(ii)

- භාණ්ඩයක මිල ඉහළ යන විට මුළු අය භාරය පහළ වැටෙයි නම් එයට හේතුව එම භාණ්ඩයේ ඉල්ලුම නම්‍යවීමයි. භාණ්ඩයක මිල ඉහළ යන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් ඉල්ලුම් ප්‍රමාණය අඩුවන විට මුළු අය භාරය අඩුවේ

(ල.02)




$OP_0BQ_1 > OP_1AQ_O$

(රූපය අත්‍යවශ්‍ය නොවේ.)

(iii.) (a) $Qd = a - b\,p$

$108 = a - \frac{84}{14}(10)$

$108 = a - 60$

$a = 168 \qquad b = 6$

$Qd = 168 - 6p$

(ල.01)

$Qs = c + dp$

$8 = c + \frac{56}{14}(10)$

$8 = c + 40$

$C = -32$

$Qs = -32 + 4p$

(ල.01)

සමතුලිත මිල : $Qs = Qd$

$-32 + 4p = 168 - 6p$

$10p = 200$

P = රු.20

(ල.01)

සමතුලිත ප්‍රමාණය : $Qd = 168 - 6\,(20)$

= ඒකක 48

(ල.01)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(b)

- මිල ඉල්ලුම් නම්‍යතාව $= \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q}$

$= -6 \times \frac{20}{48}$

$= -2.5$

(ල.01)

මිල සැපයුම් නම්‍යතාව $= \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q}$

$= 4 \times \frac{20}{48}$

$= 1.66$

(ල.01)

(iv)

(a)




කුකුළු මස්වල සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය අඩු වේ.

(ල.01)

(b)




කුකුළු මස්වල සමතුලිත මිල ඉහළ ගොස් සමතුලිත ප්‍රමාණය අඩු වේ.

(ල.01)

(C)




කුකුළු මස්වල සමතුලිත මිල සමතුලිත ප්‍රමාණය ඉහළ යයි.

(ල.01)

(d)




කුකුළු මස්වල සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය පහළ වැටෙයි .



(ල.01)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources




(V)

- ගිෆන් භාණ්ඩයක් යනු මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවක් ඇති බාල භාණ්ඩ විශේෂයකි.
- ගිෆන් භාණ්ඩයක මිල වෙනස් වන විට ආදායම් ප්‍රතිවිපාකය සහ ආදේශන ප්‍රතිවිපාකය එකිනෙකට ප්‍රතිවිරුද්ධව ක්‍රියාත්මක වේ.
- මිල ඉහළ යන විට භාණ්ඩයේ සාපේක්ෂ මිල ඉහළ යාම නිසා ආදේශන ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් ප්‍රමාණය අඩු වෙයි.නමුත් මූර්ථ ආදායම අඩුවීම නිසා ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ.
- මිල ඉහළ යන විට (ඍණ) ආදේශන ප්‍රතිවිපාකයට වඩා (ධන) ආදායම් ප්‍රතිවිපාකය බලවත් නිසා ඉල්ලුම් ප්‍රමාණය වැඩි වී ඉල්ලුම් වක්‍රය ඉහළට බෑවුම් වේ.

(කරුණකට ල.01 බැගින් ල.04)

3.(i)

තරගකාරී වෙළඳපොලක අලෙවි වන භාණ්ඩයක් මත බදු පැනවූ විට සමතුලිත නිමැවුම් මට්ටම සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවක් ඇති කරයි.නිෂ්පාදිතය මත බද්දක් පැනවූ විට සමතුලිත නිමැවුම් මට්ටම කාර්යක්ෂම අගයට වඩා අඩු වීම හේතුවෙන් ආන්තික පිරිවැයට වඩා ආන්තික ප්‍රතිලාභය ඉහළ ගොස් සමස්ත ආර්ථික අතිරික්තයෙන් කොටසක් සමාජයට අහිමි වී සමාජ ශුභ සාධනය පහළ වැටෙයි. (ල.02)




ඉහත රූපයට අනුව බද්දට පෙර සමතුලිත ප්‍රමාණයේදී MC = MB කොන්දේසිය ඉටුවන නිසා ආර්ථික අතිරික්තය උපරිම වේ. නමුත් බද්දෙන් පසුව සමතුලිත ප්‍රමාණය $Q_1$ ට අඩුවීම නිසා MB > MC වීමෙන් ABC ත්‍රිකෝණයට සමානව ශුභසාධනය පහළ වැටෙයි.

(රූපය පැහැදිලි කිරීමට ල.02)

(ii)

- අධි ඉල්ලුමක් හට ගැනීම (භාණ්ඩ හිඟය)
- නෛතික වශයෙන් මිල පහල වැටීම
- භාණ්ඩ සැඟවීම
- කළු කඩ වෙළඳපොළක් ඇතිවීම
- භාණ්ඩයේ ගුණත්වය පහළ දැමීම
- පාරිභෝගිකයින්ට භාණ්ඩයේ මිලට අමතරව මිලදී ගැනීම සඳහා අමතර ආවස්ථික පිරිවැයක් දැරීමට සිදුවීම
- උපරිම මිල වෙළඳපොළේ පවත්වා ගැනීමට රජයට පිරිවැයක් දැරීමට සිදුවීම
- සමාජ ශුභසාධනය පහළ වැටීම

(කරුණු 4 කට ලකුණු 04)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

(iii) (a)

සමතුලිත මිල :- $-2000 + 4p = 4000 - 2p$

$6p = 6000$

P =රු. 1000 (ල.01)

සමතුලිත ප්‍රමාණය $Q = 4000 - 2(1000)$

= ඒකක 2000

(b) සහනාධාරයට පසු සමතුලිත මිල හා ප්‍රමාණය

$-2000 + 4(p+150) = 4000 - 2p$

$-1400 + 4p = 4000 - 2p$

$6p = 5400 : p = 900$

$Q = 4000 - 2(900)$

$= 4000 - 1800$

$= 2200$

සහනාධාර පිරිවැය = 150 X 2200

= රු.3 30,000

(ල.02)

(C)

- සහනාධාරය මුළු මනින්ම නිෂ්පාදකයාට රජය විසින් මුදලින් ලබා දුන්නද එහි ප්‍රතිලාභය මුළු මනින්ම නිෂ්පාදකයින්ට හිමි නොවේ. සහනාධාරය නිසා වෙළඳ පොළ මිල රු.100කින් අඩුවන නිසා සහනාධාරයේ වැඩි ප්‍රතිලාභය පාරිභෝගිකයින්ට හිමිවන අතර ඒකකයන් සඳහා නිෂ්පාදකයින්ට ලැබෙන ප්‍රතිලාභය රු.50කි.මේ අනුව සහනාධාරයේ වාසිය නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් අතර බෙදී යයි.

(ල.02)

(d)

සහනාධරය නිසා ශුභසාධනයට සිදුවන බලපෑම (DWL)

$$DWL = \frac{\text{සහනාධාරය X සමතුලිත ප්‍රමාණයේ වෙනස}}{2}$$

$$= \frac{150 \text{ X } (2200 - 2000)}{2})$$

$$= \frac{150 X\ 200}{2}$$

= රු.15000 (ල.02)




රූප සටහන අත්‍යවශ්‍යය නොවේ .

(iii)

- ස්වාරක්ෂක තොග පාලනය
- සහතික මිල යටතේ මිලට ගැනීම
- සහතික මිල යටතේ ඌණ පූර්ණ ගෙවීම
- ස්වේච්ඡාවෙන් නිෂ්පාදනය සීමා කර ගැනීමට පෙළඹවීම
- නිෂ්පාදනය නොකර සිටීම සඳහා සහනාධාර සැපයීම
- අතිරික්ත නිමැවුම භාවිතයෙන් වෙනත් නිෂ්පාදිත දිරිගැන්වීම
- අතිරික්තය අපනයනය කිරීමට පහසුකම් සැපයීම
- වෙළෙඳපොළේ ඉල්ලුම පිළිබඳ පුරෝකතනයන් ගොවීන්ට ලබාදීම

(කරුණු 04කට ල.04)

4. (i)

- කෙටි කාලයේදී ව්‍යාපාරික ආයතනයක් ස්ථාවර සාධක තොගයක් සමඟ විචල්‍ය සාධකය මිශ්‍ර කරමින් නිෂ්පාදනය කරයි.එහිදී නිමැවුම් මට්ටම වැඩි කිරීම සඳහා එකම තේරීම වන්නේ විචල්‍ය සාධකය ඉහළ නැංවීමයි.

(ල.01)

- ස්ථාවර සාධකය මතට විචල්‍ය සාධකය යොදමින් නිෂ්පාදනය කරන විට ස්ථාවර සාධකය සහ විචල්‍ය සාධකය අතර සාධක අනුපාතය (K/L)වෙනස් වන බැවින් ඊට අනුරූපව මුළු නිමැවුමේ හැසිරීමද වෙනස් වේ.

(ල.01)

- විචල්‍ය සාධකය සේවා නියුක්ත කිරීමත් සමග මුලදී ආන්තික ඵලදාව ඉහළ ගොස් සාධක අනුපාතය නොගැලපෙන අවස්ථාවට පැමිණි විට ආන්තික ඵලදාව පහළ වැටීමට පටන් ගනියි. මේ අනුව විචල්‍ය සාධකයේ යම් ප්‍රමාණයකින් පසුව ආන්තික ඵලදාව අඛණ්ඩව පහළ වැටෙන නිසා මෙම හැසිරීම හීන වන ආන්තික ඵලදා නීතිය (The law of diminishing marginal retunes ) යනුවෙන් හැඳින්වේ.

(ල.01)

- නිෂ්පාදනයේ මෙම හැසිරීම හෝ හීනවන ආන්තික ඵලදා නීතිය ක්‍රියාත්මක වීමට නම් සපුරාලිය යුතු කොන්දේසි /උපකල්පන කිහිපයක් තිබේ.

1. ස්ථාවර සාධක වෙනස් නොවන බව (ධාරිතාව ස්ථාවරව පවතින බව)
2. එක් විචල්‍ය සාධකයක් පමණක් වෙනස් කළ හැකි බව
3. විචල්‍ය සාධකයේ සෑම ඒකකයක්ම සමජාතීය වන බව
4. නිෂ්පාදන තාක්ෂණය ස්ථාවරව පවතින බව
5. විචල්‍ය සාධකය අඛණ්ඩව සේවා නියුක්ත කරන බව
6. කෙටි කාලය සැලකිල්ලට ගන්නා බව
7. යෙදවුම්වල මිල ගණන් ස්ථාවරව පවතින බව

(උපකල්පන 2 කට ල.01)

(ii)

- දිගු කාලයේදී ව්‍යාපාරික ආයතනයක් සියලුම යෙදවුම් සමානුපාතිකව ඉහළ දමමින් නිෂ්පාදනය කරන විට මුළු නිමැවුමෙහි (මුළු ඵලදාවෙහි) සිදුවන වෙනස පරිමාණානුකූල ඵල ලෙස හැඳින්වේ. පරිමාණානුකූල ඵල හැසිරෙන ආකාරයමත ආයතනයක දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වෙනස් වන ආකාරය රඳා පවතී.
- යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් නිමැවුම ඉහළ යන විට වැඩෙන පරිමාණානුකූල ඵළ ලබන අතර එවිට දිගුකාලීන සාමාන්‍ය පිරිවැය පහළ වැටෙයි. මේ තත්ත්වය පරිමාණානුකූල පිරි මැසුම් ලෙස සැලකේ.
- යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට වඩා අඩු ප්‍රතිශතයකින් නිමැවුම ඉහළ යන විට හීන වන පරිමාණානුකූල ඵල ලබන අතර එවිට දිගුකාලීන සාමාන්‍ය පිරිවැය ඉහළ යයි. මේ තත්ත්වය පරිමාණානුකූල නොපිරිමැසුම් ලෙස සැලකේ.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට සමාන ප්‍රතිශතයකින් නිමැවුම ඉහළ යන විට ස්ථාවර පරිමාණානුකූල ඵල ලබන අතර එවිට දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වෙනස් නොවන බැවින් මේ තත්ත්වය ස්ථාවර පිරිවැය ලෙස හැඳින්වේ. (කරුණු 4 ට ල.04)

(iii)

- ව්‍යාපාරික ආයතනයක් ආන්තික පිරිවැය ඉහළ යමින් පවතින අවස්ථාවේදී ආන්තික පිරිවැය සහ ආන්තික අය භාරය සමාන වෙන නිමැවුම් මට්ටම නිපදවීමෙන් එම ආයතනයේ ආර්ථික ලාභය උපරිම වන බව හෝ ආර්ථික අලාභය අවම වන බව ලාභ උපරිම කිරීමේ නීතියෙන් කියවෙයි.

(ල.01)

- ලාභ උපරිම වීමේ නීතිය ක්‍රියාත්මක වන විට
  MC = MR
  MC වක්‍රයේ බෑවුම > MR වක්‍රයේ බෑවුම
  කොන්දේසි ඉටු විය යුතු ය.

(ල.01)

- වෙළඳ පොළ ව්‍යුහය තුළ මිල ගනුවෙක් වශයෙන් ක්‍රියාත්මක වන්නේ පූර්ණ තරගකාරී ආයතන පමණි. එම ආයතනය කොතරම් අලෙවි කළද මිල ස්ථාවරව පවතින නිසා මිල ආන්තික අයභාරයට සමාන වේ.

(ල.01)

$$MR = \frac{\Delta TR}{\Delta Q} \qquad \Delta TR = P \times \Delta Q$$

$$MR = \frac{P \times \Delta Q}{\Delta Q}$$

$$MR = P$$

- මේ නිසා මිල ගනුවෙකු වන පූර්ණ තරගයේ ආයතනයක් ලාභ උපරිම කරගැනීම MC = MR වෙනුවට MC = P කොන්දේසිය යෙදිය හැක.

(ල.01)

(iv)a

මුල් ස්ථාවර පිරිවැය (TFC)

නිෂ්පාදක අතිරික්තය = ආර්ථික ලාභය + මුළු ස්ථාවර පිරිවැය

$PS = \pi + TFC$

$160 = -240 + TFC$

$TFC = 400$

(ල.02)

(b) මුල් සමතුලිත යෙදී

$\pi = TR - TC$

$TC = TR - \pi$

$TC = 3200 - (-240)$

$TC = 3440$



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

TVC = 3440 – 400

TVC = 3040

මිල අඩුවීමෙන් පසු TVC = 3040 – 2320

= 720

TC = 720 + 400

= 1120

TR = 30 X 40

TR = 1200

$\pi$ = 1200 – 1120

= 80

ආර්ථික ලාභයක් ලබන නිසා නිෂ්පාදනය තවදුරටත් කරගෙන යයි .  (ල.02)

(V)

- සාධක වෙළඳපොල තුළ සාධක හිමියන්ගේ මුළු ඉපැයුම තුළ ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයුම අතර සාපේක්ෂ වෙනස රඳා පවතින්නේ සාධකයේ සැපයුම් නම්‍යතාව මතය. කිසියම් සාධකයක සැපයුම පූර්ණ නම්‍ය වේනම් ආර්ථික බදු කුලිය ශුන්‍ය වන අතර මුළු ඉපැයුම සංක්‍රාම ඉපැයුමට අයත් වේ.




(ල.02)

- කිසියම් සාධකයක සැපයුම පූර්ණ අනම්‍ය වේනම් එම සාධකයේ මුළු ඉපැයුමම ආර්ථික බදු කුලියට අයත් වේ.




(ල.02)

5.(i)

- භූමි ප්‍රදේශය (ප්‍රධාන භූමිය හා දූපත්)
- මුහුදු සීමාව
- ගුවන් අවකාශය
- මහද්වීපික තටකයට අයත් භූමිය
- වෙනත් රටවල පිහිටි ආර්ථික කලාප
- වෙනත් රටවල පිහිටි (තානාපති කාර්යාල,යුද කඳවුරු හා විද්‍යාත්මක ස්ථාන)

(කරුණු 4 කට ල .04)

(ii)

- නිෂ්පාදනය කර අලෙවිකරන සියලුම භාණ්ඩ හා සේවා
- නිෂ්පාදනය කර ස්ව පරිභෝජනයට හෝ ස්ව ප්‍රාග්ධන සම්පාදනයට රඳවා ගනු ලබන භාණ්ඩ
- අයිතිකරුවන් වාසය කරන නිවෙස් වලින් සැපයෙන නේවාසික සේවාව
- වැටුප් ලබන සේවකයින් විසින් සපයන ගෘහ සේවා සහ පෞද්ගලික සේවා
- නිෂ්පාදනය කර ස්ව පරිභෝජනයට හෝ ස්ව ප්‍රාග්ධන සම්පාදනයට රඳවා ගනු ලබන දැනුම ගබඩා කෙරෙන නිෂ්පාදිත (කරුණු 4 කට ල .04)

(iii) a) දළජාතික ආදායම

(i) ක්‍රමය GNI = C+I+G+X-M + NPIA
= 6000+2800+3200+2500-3500-400
=10,600

(ii) ක්‍රමය GNI = CE +GOS +GMI+OTN+TOP+NPIA
= 2500+3500+3500+300+1200-400
=10 600

(iii) ක්‍රමය GNI = A +I +S+TOP+NPIA
= 800+4000+5000+1200-400
= 10 600

(ඕනෑම ක්‍රමයකට ල.02)

(b) වැයකළ හැකි දළ ජාතික ආදායම = ද.ජා.ආදායම + වි.ශු.ජං.සංක්‍රාම
= 10 600+1400
= 12000

(ල.02)

(c) ජාතික ඉතුරුම් = වැයකළ හැකි ද.ජා.ආදායම - මුළු පරිභෝජනය
= 12000 – (6000+3200)
= 2800

(ල.01)

දේශිය ඉතුරුම් = I + X -M
= 2800 + 2500 -3500
= 1800 (ල.01)

(iv)(a)

- MPC = 0.8 නිසා වියදම් ගුණකය 5 ක් ද ,ස්ථාවර බදු ගුණකය - 4ක් ද වේ.
- රාජ්‍ය වියදම් රු.බි.100 කින් ඉහළ යන විට ජාතික ආදායම රු.බි.500කින් ඉහළ යයි.
- ස්ථාවර බදු 100කින් ඉහළ යනවිට ජාතික ආදායම රු.බි.400 කින් ඉහළ යයි.
- රාජ්‍ය වියදම් හා ස්ථාවර බදු රු.බි.100 බැගින් ඉහළ දමන විට ජාතික ආදායම රු.බි.100 කින් ඉහළ යයි.

(කරුණු 4 කට ල.04)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

(b) KE = $^{\Delta Y}/_{\Delta I}$

KE = $\frac{1}{1-0.8}$ = 5

5 = $\frac{\Delta Y}{50}$

ΔY = 250

MPC = $\frac{\Delta C}{\Delta Y}$

0.8 = $\frac{\Delta C}{250}$

ΔC = 200

පරිභෝජනය රු.බි.200 කින් ඉහළ යයි . (ල.02)

6.(i)පුද්ගලයින් පූර්ණ ද්‍රවශීල වත්කමක් හැටියට ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතු ළඟ තබා ගැනීමට දක්වන සුවිශේෂී රුචිය ආර්ථික විද්‍යාවේදී හඳුන්වන්නේ ද්‍රවශීලතා වරණය යනුවෙන් හෝ මුදල් ඉල්ලුම යනුවෙනි.පුද්ගලයින් ද්‍රවශීලතාව කෙරෙහි වරණයක් දැක්වීමට බලපාන සාධක තුනක් තිබේ. (ල.01)

1. ගනුදෙනු චේතනාව (ල.01)
2. ආරක්ෂණ චේතනාව (ල.01)
3. සමපේක්ෂණ චේතනාව (ල.01)

(ii) a

- මූල්‍ය අධිකාරිය හෝ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අභ්‍යන්තර වටිනාකමක් නොමැති කාසි හා නෝට්ටු ව්‍යවහාර මුදල් වලට අයත් වන අතර රජයේ නියෝගය නිසා ඒවා පොදු පිළිගැනීමට ලක් වේ.

උදා - ශ්‍රී ලංකා රුපියල්, us ඩොලර් (ල.01)

- ඉහළ ද්‍රවශීලතාවක් සහිත කෙටි කාලයකින් සහ අඩු ආවස්ථික පිරිවැයකින් හුවමාරු මාධ්‍යයක් බවට පත්කර ගත හැකි මූල්‍ය වත්කම් ආසන්න මුදල් වලට අයත් වේ. මේවා හුවමාරු මාධ්‍යයන් ලෙස භාවිත කළ නොහැකි වුවද වටිනාකමේ සංනිධියක් ලෙස භාවිත වේ.

උදා :- ඉතුරුම් තැන්පතු ,කාලීන තැන්පතු

(ල.01)

(b)

- ව්‍යවහාර මුදල් හෝ ඉල්ලුම් තැන්පතු වෙනුවට හුවමාරු මාධ්‍යයන් ලෙස තාවකාලිකව යොදා ගත හැකි ණයපත් සහ හරපත් ආදේශක මුදල් වලට අයත් වේ. ණය මුදල / සීමාව සහ තැන්පතු ශේෂය අවසන් වූ විට මේවා ගනුදෙනු පියවීම සඳහා යොදාගත නොහැක.

(ල.01)

- විද්‍යුත් උපකරණයක (කාඩ් එකක/ ජ.දුරකථනයක හෝ/ මාර්ගගත ගිණුමක) සංඛ්‍යාංක ලෙස ගබඩා වී ඇති ජාලයන් හරහා ගෙවීම් පියවීමට යොදා ගත හැකි මුදල් විද්‍යුත් මුදල් හෝ ඩිජිටල් මුදල් ලෙස සැලකේ.

උදා :- ක්‍රිප්ටො කරන්සි, / Apple pay (ල.01)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iii)USA හා ඊශ්‍රායලය විසින් ඉරානයට ගුවන් ප්‍රහාර එල්ල කිරීමත් සමඟ මැද පෙරදිග කලාපයේ යුධ උණුසුම ඉහළ ගිය අතර ප්‍රධාන තෙල් ප්‍රවාහන මාර්ගයක් වන හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීමට ඉරානය තීරණය කළේය. එහි ප්‍රතිඵලයක් හැටියට සැපයුම් දාම අවහිරවීමත්, ඉදිරි අවිනිශ්චිත තත්ත්වයත් නිසා ගෝලීය තෙල් සැපයුම අඩු වී ඉන්ධන මිල තියුණු ලෙස ඉහළ ගියේය. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ පෙට්‍රල් මිල 46% පමණ වැඩි විය. පෙට්‍රල්, ඩීසල්, ගෑස් සහ විදුලිය ආදි මූලික යෙදවුම්වල මිල ඉහළ යාම නිසා සමස්ත ආර්ථිකයේම නිෂ්පාදන පිරිවැය ඉහළ යාමෙන් පහත රූපයේ දැක්වෙන පරිදි ශ්‍රී ලංකාවේ පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයක් ඇති විය.

(පැහැදිලි කිරීමට ල.02)




(නිවැරදි රූපසටහනට ල.02)

(iv)

- ශ්‍රී ලංකා මහා බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතය ඉහළ දැමීම ඉතා ඉක්මනින් බැංකු පද්ධතියට සම්ප්‍රේෂණය වී බැංකු පද්ධතියේ ණය පොලී අනුපාත ඉහළ ගියේය. ණය පොලී අනුපාත ඉහල යන විට පොලී සංවේදී ආයෝජන සහ පරිභෝජන වියදම් අඩුවීමෙන් සමාහාර ඉල්ලුම ඉහළ යාම පාලනය වීම හෝ පහළ වැටීම නිසා ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය පාලනය වෙයි. මෙම සිද්ධිය සංකෝචනාත්මක මූල්‍යය ප්‍රතිපත්තියට අයත් වේ. මේ අනුව මෙම ප්‍රතිපත්තිය නිසා මිල මට්ටම ඉහළ යාම පාලනය වීමක් හෝ පහල වැටීමක් සිදුවිය හැක. (ල.04)




ප්‍රතිපත්ති පොලී අනුපාතය ඉහළ නැංවීම නිසා AD වක්‍රය වමට විතැන් වේ .

(පැහැදිලි කිරීම නොමැතිව රූප සටහන නිවැරදිව ඇඳ තිබේ නම් (ල.02)

(V) a

මුදල් සැපයුම = මහජනයා සතු ව්‍යවහාර මුදල් + ඉල්ලුම් තැන්පතු

- මහජනයා සතුව ව්‍යවහාර මුදල් රු.බි.4500ක් ඇති අතර එයින් 500ක් තැන්පතු බවට පත්කළවිට රු.බි.4000ක් බවට පත්වේ.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

- තැන්පතු ගුණකය 8 $(1/r)$ ක් නිසා බැංකු පද්ධතියේ තැන්පතු ප්‍රමාණය 8000 ක් දක්වා ඉහළයයි .එවිට මුදල් සැපයුම රුපියල් බිලියන 12 000කි.

(ල.02)

(b) මුදල් ගුණකය $= \frac{\text{මුදල් සැපයුම}}{\text{සංචිත මුදල්}}$

$= \frac{120000}{4000+1000}$

$= 2.4$ (ල.02)

7.(i)

- යම් ආර්ථික කටයුත්තක් හෝ ආර්ථික සංසිද්ධියක් සමාජය අපේක්ෂා කරනු ලබන වඩාත් හොඳම ආකාරයට (ප්‍රශස්ත මට්ටමට) සිදු කිරීමට වෙළඳපොළ යාන්ත්‍රණය අසමත් වීම වෙළඳපොළ අසමත් වීමක් ලෙස සැලකේ. මෙයින් අදහස් කරනු ලබන්නේ වෙළඳපොළ යාන්ත්‍රණය හානිකර බව නොව සමහර ආර්ථික කටයුතු හොඳම මට්ටමින් සිදු නොකෙරෙන බව පමණි. වෙළෙඳපොළ අසාර්ථක වන මූලික ස්වරූපයක් වනුයේ සම්පත් අකාර්යක්ෂම ලෙස බෙදීයාමයි. (ල.02)
- සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වෙන අවස්ථා
  - බාහිරතා පැවතීම
  - ශුද්ධ පොදු භාණ්ඩ නොසැපයීම
  - අර්ධ පොදු භාණ්ඩ ඌණ පරිභෝජනය
  - පොදු දේපළ සම්පත් අධිභාවිතය
  - අවගුණ භාණ්ඩ අධි පාරිභෝජනය
  - ශුභසාධන භාණ්ඩ ඌණ පරිභෝජනය
  - වෙළඳපොළ තරඟයෙන් ඉවත්වීම
  - අපූර්ණ තොරතුරු මත තීරණ ගැනීම. (ඕනෑම කරුණු 3කට ල.03)

(ii) රාජ්‍ය ආදායමේ % අගය

| බද්ද | 2024 | 2025 |
|---|---|---|
| එකතු කළ වටිනාකම් බදු | 32 .5 | 32.1 |
| ආදායම් බදු | 25.5 | 20.9 |
| නිෂ්පාදන බදු | 14.8 | 19.4 |
| ආනයන මත බදු | 2.8 | 5.1 |

(එක් වර්ෂයකට අදාළව බදු වර්ග තුනක ආසන්න අගයන් ලබා දී තිබේ නම් ලකුණු 3ක් දෙන්න)

(iii)

- අයවැය හිඟය පියවීමට වර්තමානයේදී බැංකු මූලාශ්‍ර ලෙස යොදා ගනු ලබන්නේ වාණිජ බැංකු පමණි. මහ බැංකුව සෘජුවම රජයට ණය සැපයීමක් සිදු නොකෙරේ. බැංකු මගින් රජය ණය ලබා ගැනීමේදී සෘජුවම මුදල් සැපයුමේ ඉහළ යමක් සිදුවන බැවින් එය සමාහාර ඉල්ලුම වැඩි කිරීම නිසා උද්ධමන පීඩනයක් ඇති විය හැක.මීට අමතරව බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව අඩුවීම නිසා පොලී අනුපාත ඉහළ යාමේ ප්‍රවණතාවක්ද ඇතිවේ. (ල.02)
- දේශීය වෙළඳපොළේ බැංකු නොවන මූලාශ්‍ර ලෙස සැලකෙන්නේ බලපත්‍ර ලාභී විශේෂිත බැංකු, මූල්‍ය සමාගම් රක්ෂණ සමාගම් සහ විශ්‍රාම අරමුදල් ආදියයි. මෙම ආයතන මහජනතාව යන නිර්වචනයට අයත් වන නිසා මේවායෙන් ලබා ගන්නා ණය පදනම් කරගෙන මුදල් සැපයුමේ වැඩිවීමක් සිදු නොවේ. නමුත් ණය ඉල්ලුම ඉහළ යාම නිසා පොලී අනුපාත ඉහළයාමත් ,අරමුදල් හිඟයත් නිසා මෙම අංශයෙන් රජය ණය ලබා ගන්නා විට පෞද්ගලික ආයෝජන පහළ වැටීමක් සිදුවී ජාතික ආදායම හා සේවා නියුක්තිය අඩුවිය හැක.

(ල.02)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iv) a

- ශ්‍රී ලන්කන් ගුවන් සමාගම
- ලංකා විදුලිබල මණ්ඩලය
- ලංකා සීනි සමාගම
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
- ශ්‍රී ලංකා තැපැල්
- ශ්‍රී ලංකා දුම්රිය

(උදාහරණ 4කට ල.04)

(b)

- මිල නිෂ්පාදනයේ සාමාන්‍ය පිරිවැයට වඩා අඩුවෙන් පවත්වා ගැනීම
- වැටුප් ඉහළ යාම/ දමා ගැනීම
- අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා සේවා නියුක්ත කිරීම
- අඩු ඵලදායිතාව
- භාණ්ඩ හා සේවාවල ගුණත්වය දියුණු නොවීම
- දේශපාලන ඇඟිලි ගැසීම
- දුර්වල කළමනාකරණය
- ඉහළ ණය පොලී ගෙවීම්
- නාස්තිය සහ දූෂණය

(කරුණු 4කට ල. 04.)

9.)

(i) a

- ඉන්දියාවේ රෙදි පිළි ඒකකයක ආවස්ථික පිරිවැය = 10/5 = 2.0
- ඉන්දියාවේ විදුලි පංකාවක ආවස්ථික පිරිවැය = 5/10 = 0.5

(ල.01)

- චීනයේ රෙදි පිළි ඒකකය ආවස්ථික පිරිවැය = 6/4 =1.5
- චීනයේ විදුලි පංකාවක ආවස්ථික පිරිවැය = 4/6 = 0.66

(ල.01)

- චීනය රෙදි පිළි කෙරෙහි විශේෂීකරණය විය යුතුය. (ල.01)
- ඉන්දියාව විදුලිපංකා මත විශේෂීකරණය කළ යුතුය. (ල.01)

(b)

- අන්‍යෝන්‍ය ලෙස වාසි දායක හුවමාරුවක් ඇති වීම සඳහා රෙදි පිළි ඒකකයක් විදුලි පංකා 1.5ත් 2.0ත් අතර පරාසය තුළ හුවමාරු වී යුතු ය .
- විදුලි පංකාවක් රෙදි පිළි ඒකක 0.5ත් 0.66ත් අතර අගයකට හුවමාරු විය යුතුයි.

(ඕනෑම එක් ක්‍රමයකට ල.02)

(ii)a

- දේශීය ළදරු කර්මාන්ත ආරක්ෂා කිරීම
- දේශීය සේවා නියුක්තිය ආරක්ෂා කිරීම
- උපාය මාර්ගික කර්මාන්ත (ආහාර , ඉන්ධන, යුධ අවි, ඖෂධ) ආරක්ෂා කර ගැනීම
- ප්‍රපතනය වැළැක්වීම (අසාධාරණ වෙළදාම සීමා කිරීම)
- ගෙවුම් විශේෂ ගැටලු නිරාකරණය කිරීම



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- ආනයන මත රැඳියාව අඩු කිරීම
- අවගුණ භාණ්ඩ පරිභෝජනය සීමා කිරීම
- ජාතික ආරක්ෂාව තහවුරු කිරීම
- දේශීය ආර්ථිකයේ විවිධාංගීකරණයක් ඇති කිරීම
- දේශීය සම්පත් උපයෝජනය ඉහළ නැංවීම

(කරුණු 2කට ල.02)

(b)

- දේශීය නිෂ්පාදිතයට ආරක්ෂණයක් ලබාදීම සඳහා හිමි භාණ්ඩය ආනයනය කිරීමේදී පනවනු ලබන තීරුබද්ධ හේතු කොටගෙන දේශීය නිෂ්පාදිතයේ දේශීය එකතු කළ අගය ඉහළ යන ප්‍රතිශතය සඵල ආරක්ෂණ අනුපාතිකයයි.

$$ERP = \frac{\overset{*}{V} - V}{V} X\ 100$$ (ල.01)

විකල්ප පිළිතුර

නිදහස් වෙළඳාම යටතේ දේශීය එකතු කළ වටිනාකම = V
තීරු බද්දට පසු දේශීය එකතු කළ වටිනාකම = $\overset{*}{V}$ (ල.01)

- බලපාන සාධක
  - නිමි භාණ්ඩය මත පනවන නාමික තීරු බදු අනුපාතය
  - ආනයනික යෙදවුම් මත පන වන නාමික තීරු බදු ප්‍රතිශතය
  - දේශීය නිමි භාණ්ඩය තුළ ඇති ආනයනික යෙදවුම් ප්‍රතිශතය
  - දේශීය නිමි භාණ්ඩයේ වටිනාකම තුළ ඇති දේශීය එකතු කළ වටිනාකම් ප්‍රතිශතය

(කරුණු 2කට ල .02)

(iii)

- ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)
- ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම(SLTFTA)

(ගිවිසුම 2කට ල.02)

(iv)

a) ජංගම හෝ භාණ්ඩ ගිණුම බැර, මූල්‍ය ගිණුම මුදල් හා තැන්පතු හර
b) මූල්‍ය ගිණුම සංචිත වත්කම් බැර ,මූල්‍ය ගිණුම අනෙකුත් ආයෝජන හර
c) ජංගම හෝ ද්විතියක ආදායම් ගිණුම බැර ,අනෙකුත් ආයෝජන මුදල් හා තැන්පතු හර
d) නේවාසිකයින් අතර ගණුදෙනුවක් නිසා ගෙවුම් ශේෂයට ඇතුළත් නොකෙරේ.

(ලකුණු 01 බැගින් ල.04 )

(v)

- විදේශිකයින් හට මෙරට අපනයනවල මිල ඉහළ යාම
- අපනයන වලට ඇති ඉල්ලුම අඩුවීම
- ආනයනවල දේශීය මිල අඩුවීම
- ආනයන වල දේශීය ඉල්ලුම ඉහළ යාම
- වෙළඳ ශේෂයේ හිඟය ඉහළ යාම
- දේශීය කර්මාන්තවල නිෂ්පාදන පිරිවැය අඩුවීම



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- ආනයනික යෙදවුම්වල මිල අඩුවීම
- උද්ධමන පීඩනය අඩුවීම
- රුපියල් වලින් විදේශ ණය අඩුවීම
- සංචාරක කර්මාන්තය අධෛර්යමත් වීම
- විදේශ ආයෝජන අධෛර්යමත් වීම
- දේශීය පාරිභෝගිකයන්ගේ ක්‍රය ශක්තිය ඉහළ යාම
- දේශීය කර්මාන්තවලට ඇති තරඟය ඉහළයාම (ඕනෑම කරුණු 03කට ල.03)

9. (i)

- ආර්ථික වෘද්ධිය ලෙස සැලකෙන්නේ (රටක) ආර්ථිකයක විභව නිමැවුම හෝ නිෂ්පාදන ධාරිතාව හෝ පූර්ණ සේවා නියුක්ති නිමැවුම දිගුකාලීනව ඉහළ යාමයි. මෙහිදී අපේක්ෂා කරන්නේ මූර්ථ නිමැවුමේ වැඩිවීමක් නොව නිෂ්පාදන හැකියාවෙහි ඉහළ යාමකි. සම්පත් සම්භාරය ඉහළ යාම හෝ සාධක ඵලදායිතාවේ ඉහළ යාමක් ආර්ථික වෘද්ධියට හේතුවේ. (ල.02)

- ආර්ථික වෘද්ධියේදී නිෂ්පාදන හැකියා වක්‍රය පිටතට විතැන්වීමක් සිදුවේ.




(ල.01)

- ආර්ථික වෘද්ධියේදී දිගුකාලීන සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.




(ii) (a) (ල.01)

- අධ්‍යාපනය
- සෞඛ්‍යය
- ජීවන තත්ත්වය. (කරුණු 03කට ල.03)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(b)

- 2023 වර්ෂයේදී සමෘද්ධි ශුභසාධන වැඩසටහන වෙනුවට අස්වැසුම වැඩසටහන ආරම්භ විය. මෙයින් සෘජුවම සිදුවන්නේ අඩු ආදායම් ලබන හෝ දරිද්‍රතාවයෙන් පෙළෙන කුටුම්භ සඳහා මුදල් සංක්‍රාම ලබා දීමයි. මෙහිදී කුටුම්බයේ ආදායම, වත්කම් හා දේපළ, ජීවත්වීමේ පරිසරය, කුටුම්භයේ සංයුතිය සහ වෙනත් සමාජ ආර්ථික දර්ශක පාදක කර ගනිමින් ප්‍රතිලාභ ලබාදේ. ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී කුටුම්භ ලක්ෂ 17ක් පමණ මෙම ප්‍රතිලාභ ලබන බැවින් වැඩසටහන දරිද්‍රතාව අඩු කිරීම සඳහා සැලකිය යුතු ලෙස දායක වේ.
- මෙම වැඩසටහන මගින් පවුල් කණ්ඩායම් 4කට බෙදා මූල්‍යාධාර සැපයේ.
    1. අන්ත දිළිඳු කුටුම්බ
    2. දිළිඳු කුටුම්බ
    3. අවධානමට ලක් වූ කුඩුම්බ
    4. සංක්‍රාන්ති කුටුම්බ
- මීට අමතරව වැඩිහිටි දීමනා ,ආබාධිත පුද්ගල දීමනා සහ වකුගඩු රෝගීන් සඳහා දීමනා වශයෙන් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ රැකවරණය සඳහාද මුදල් ආධාර සපයනු ලබයි.
- මෙම වැඩසටහන මගින් දරිද්‍රතාව අඩු කිරීම ,අඩු ආදායම් උපයන කුටුම්භවල ජීවන තත්ත්වය නගා සිටුවීම ආර්ථික අර්බුදවලින් පීඩාවට පත්වූ කුටුම්බවලට මූල්‍යාධාර සැපයීම සිදු වේ.
- අස්වැසුම මගින් ආරක්ෂණයක් අවශ්‍ය කුටුම්භ ඉලක්ක ගත කර ආධාර දීමනා සැපයීමක් සිදු වේ.
- අස්වැසුම සඳහා රජය රුපියල් බිලියන 230කට වැඩි ප්‍රමාණයක් වැය කරයි.

(කරුණු 4කට ල.04)

(iii) පහළම ආදායම් ලබන කුටුම්භ 20% ලබන ආදායම් ප්‍රතිශතය 4.6
ඉහළම ආදායම් ලබන කුටුම්භ 10% ලබන ආදායම් ප්‍රතිශතය 51.4

(කරුණුකට ල.01 බැගින් ල.02)

(iv)

I අවධිය - ඉතා ඉහළ දළ උපත් අනුපාතිකය සහ ඊට සමාන ඉහළ දල මරණ අනුපාතිකය ( ජනගහනය ස්ථාවර වීම)

II අවධිය - ඉතා ඉහල දළ උපත් අනුපාතිකය සහ දළ මරණ අනුපාතිකය පහළ වැටීම (ජන සංඛ්‍යා වර්ධනය ඉහල යාම)

III අවධිය - දළ උපත් අනුපාතිකය සහ දළ මරණ අනුපාතිකය යන දෙකම පහළ වැටෙන අතර උපත් අනුපාතිකය වඩා වේගයෙන් අඩුවීම නිසා ජන සංඛ්‍යා වර්ධනය අනුපාතිකය පහළ වැටීම .

IV අවධිය - දළ උපත් අනුපාතිකය සහ දළ මරණ අනුපාතිකය යන දෙකම ඉතා පහළ මට්ටමක ස්ථාවරවීම. (ජනගහනය ස්ථාවර වීම) (කරුණු 4කට ල.04)

(V)

- සේවා වියුක්ති අනුපාතිකය පහළ වැටී සේවා නියුක්ති අනුපාතිකය ඉහළ යාම.
- ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය 49% පමණ ස්ථාවර වීම
- සේවා අංශයේ ශ්‍රම බලකාය ඉහළ යාම
- සැලකිය යුතු පිරිසක් විදේශ රැකියාවලට පිටත්වීම
- ස්ත්‍රී ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතිකය පහළ මට්ටමක පැවතීම
- වයස්ගත ශ්‍රමිකයන් ප්‍රතිශතය ඉහළ යාම
- උගත් පිරිස අතර විරුකියාව ඉහල මට්ටමක පැවතීම

(කරුණු 3කට ල.03)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

10.(i)

- රාජ්‍ය අංශයේ රැකියා අපේක්ෂාවෙන් දිගු කාලයක් බලා සිටීම
- නිෂ්පාදන ක්‍රියාවලිය තුළින් බිහිවන දේශීය රැකියා ප්‍රමාණය ඉතා සීමිත වීම
- ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතාවලට නොගැලපෙන අධ්‍යාපනය
- පෞද්ගලික අංශයේ රැකියා ප්‍රමාණවත් නොවීම සහ ඉතා පහළ වැටුප් මට්ටම් පැවතීම (උපාධිධාරීන් සඳහා)
- තරුණ පිරිස අතර රැකියා අත්දැකීම් අඩු මට්ටමක පැවතීම
- වෘත්තීය අධ්‍යාපනය දියුණු මට්ටමක නොපැවතීම
- පාසල් හා විශ්ව විද්‍යාල වලදී ගැලපෙන ක්ෂේත්‍ර තෝරාගැනීම දුර්වල වීම
- ඉහළ වැටුප් සහිත කාර්යාලීය නිලධාරී රැකියා අපේක්ෂා කිරීම

(කරුණු 5කට ල.05)

(ii)

- ආනයන ආදේශන කර්මාන්ත ප්‍රවර්ධනය (ධීවර ,කෘෂි හා කර්මාන්ත)
- අපනයන විවිධාංගිකරණය
- අපනයනවල තරගකාරීත්වය ඉහළ නැංවීම
- සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම
- විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම
- විදේශ රැකියා ප්‍රවර්ධනය
- වෙළඳ ගිවිසුම් මගින් ජාත්‍යන්තර වෙළඳපොළ පුළුල් කර ගැනීම
- එකතු කළ අගය වැඩි නිෂ්පාදිත අපනයනයන්ට පෙළඹීම
- අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම
- විනිමය අනුපාතිකය ක්ෂයවීමට ඉඩහැරීම

(කරුණු 5කට ල.05)

(iii)

- 2022 ශ්‍රී ලංකාව බරපතල ණය අර්බුධයකට ලක් වූ අතර තවමත් විදේශ ණය ආපසු ගෙවීම් විධිමත්ව ආරම්භ වී නොමැත. මේ වන විටත් මුළු රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයට ආසන්න වී ඇත.(95%) මේ නිසා රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ප්‍රබල අවශ්‍යතාවක් පැන නැගී ඇත. (ල.01)
- රාජ්‍ය ණය සීමාව ඉක්මවා ඉහළ යාම තුළින් පොලී ගෙවීම් ඉහළ යාම නිසා රජයේ පුනරාවර්තන වියදමෙන් 50% පමණ ඒ සඳහා වැය වී තිබේ. මේ තත්ත්වය ප්‍රාග්ධන වියදම් අඩු කිරීමටත්, අනෙකුත් අත්‍යවශ්‍ය පුණරාවර්තන වියදම් අඩු කිරීමටත් හේතු වේ.

(ල.01)
- රාජ්‍ය ණය ඉහළ යන විට අයවැය හිඟය ඉහළ යාම පමණක් නොව සමාහාර ඉල්ලුම ඉහළ යාම නිසා ඇතිවන උද්ධමනය හේතුවෙන් මුදලේ අභ්‍යන්තර අගය මෙන්ම බාහිර අගය ද පහල වැටී බරපතල ආර්ථික අස්ථායිතාවක් ඇතිවේ. මීට අමතරව පොලී අනුපාත ඉතා ඉහළ යාම තුළින් පෞද්ගලික ආයෝජනය පහළ වැටීමද ගැටලුවක් වී ඇත.

(ල.01)

රාජ්‍යය ණය කළමනාකරණය සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ හැක.

- ණය අවදානම් මට්ටමට යා නොදී තිරසාර මට්ටමක පවත්වා ගැනීම
- ණය අර්බුද වළක්වා ගැනීමට කටයුතු කිරීම
- අඩු පොලී අනුපාත යටතේ ණය ගැනීම
- සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම
- ආයෝජකයින්ගේ විශ්වාසය ගොඩනැගීම
- රජයේ ආදායම් ඉහළ දමාගෙන අයවැය හිඟය පහළ දමා ගැනීම
- විදේශ සංචිත ඉහළ නංවා ගැනීම (කරුණු 2කට ල.02)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iv)

- අපනයනය කරනු ලබන රටවල ආර්ථික පසු බෑසීම
- ඛනිජතෙල් හා LP  ගෑස් ඇතුළු බලශක්ති මිල ඉහළ යාම
- වෙළඳ අනුපාතය අයහපත් ලෙස හෑසිරීම
- ගෝලීය මූල්‍ය වෙළඳ පොළවල පොලී අනුපාතය ඉහළ යාම
- US ඩොලරය වැනි ප්‍රබල මුදල් ඒකකවල තියුතු උච්චාවචනය
- අපනයන මිලට ගන්නා රටවල ආරක්ෂණවාදී ප්‍රතිපත්ති
- අඩු පිරිවැය සහිත රටවලින් පැමිණෙන තරගකාරීත්වය
- අපනයන දිශාව සංකේන්ද්‍රණය වීම
- ජාත්‍යන්තර මූල්‍ය අස්ථායිතාව
- කාලගුණ විපර්යාස මත කෘෂි අංශයේ ඵලදායිතාව අඩුවීම

(කරුණු05කට ල.05)